## 2021 මැයි මස 18 වන දින පෙරවරු 9.30 ට මොරටුව මහා නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මොරටුව මහා නගර සභාවේ 2021 මැයි මස මාසික සභා රැස්වීමේ වාර්තාව

**සහභාගීත්වය:-**

| | | | |
|---|---|---|---|
| 01. | නගරාධිපති | - | ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 02. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 05. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 06. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 07. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 08. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා |
| 09. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ඩබ්.ඩී.රන්දූ නිරෝෂන් මහතා |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ලලිත් ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | එෆ්.බී.නිලංක සිල්වා මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කුමාර රාජරත්න මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.පිලිප් ෆැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.උජිත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | දීපා චාන්දනී ආරියවංශ මහත්මිය |
| 27. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.ගාවින් මත්තෙස් මහතා |
| 28. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සුනිල් නන්දසිරි මාසකෝරාල මහතා |
| 29. | මහා නගර සභා මන්ත්‍රී | - | රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා |
| 30. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 31. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා |
| 32. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 33. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 34. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.එම්.ඒ.දෝන දිලාශිනී මහත්මිය |
| 35. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 36. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා |
| 37. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සුදර්ශනී ප්‍රියන්තිකා කුරේ මහත්මිය |
| 38. | මහා නගර සභා මන්ත්‍රී | - | මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |

| | | | |
|---|---|---|---|
| 39. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 40. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 41. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය |
| 42. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.ක්‍රිෂනි ප්‍රනාන්දු මහත්මිය |
| 43. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඞී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 44. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය |
| 45. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 46. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |

සහ

නාගරික ලේකම් (වැ.බ.) - එම්.කේ.ඞී.තාරක මුණසිංහ මහතා

ගරු නගරාධිපතිතුමාගේ ආරාධනය මත වැඩ බලන නාගරික ලේකම් එම්.කේ.ඩී.තාරක මුණසිංහ මහතා විසින් 2021.05.18 වන දින මාසික සභා රැස්වීමේ නිවේදනය සභාවට ඉදිරිපත් කරන ලදි.

## 01. වාර්තාව පිළිගැනීම හා සලකා බැලීම

2021.04.01 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 2021.04.01 දින සභා රැස්වීම් වාර්තාව පිළිගත යුතු යයි මා යෝජනා කර සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,වාර්තාවේ 3(9) අයිතමයෙ මගෙ නම සඳහන් වෙලා තියෙනවා මා කරපු ප්‍රකාශයක් නොවේ එහි නම වෙනස්විය යුතුයැයි මා ඉල්ලා සිටිනවා.

මහා නගර සභා මන්ත්‍රී,එෆ්.බී.නිලංක සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව 2021.04.01 දින පැවති මහ සභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත විය.

## 02. ගරු නගරාධිපතිතුමාගේ නිවේදන

### 2(1) නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි,රටේ පවතින වර්තමාන තත්ත්වය මත 2021 මැයි මාසයට අදාල මුදල් කමිටුව 2021.05.20 වන දින ප.ව 1.00 ට පැවැත්වෙන බවත්, මැයි මාසයට අදාල අනෙකුත් ස්ථාවර කමිටු නොපැවැත්වෙන බවත් දන්වා සිටිනවා.

### 2(2) නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අසනීප තත්ත්වය නිසා අද දිනයේ මාසික සභා රැස්වීමට සහභාගී නොවන බව ඩබ්.මැක්සි ජේ.ප්‍රනාන්දු මහා නගර සභා මන්ත්‍රීතුමා දැනුම්දීලා තියෙනවා.

## 03. සභාව අමතා එවන ලද ආයාචනා පෙත්සම් පැමිණිලි හා සන්දේශ සභාව හමුවේ තැබීම.

**03(1) මහා නගර සභා මන්ත්‍රී - එම්. තිසර රසාංජන මෙන්ඩිස් මහතා**

ගරු නගරාධිපතිතුමා, මේ වන විට දින 15 ක් මොරටුව විල්ලෝරාවත්ත ප්‍රදේශය ලොක්ඩවුන් කරලා තියෙනවා මට ආරංචිවුනා ඒ ප්‍රදේශයේ සිටින සමහර පාරවල් වලට මේ වන විටත් රජයේ නිර්දේශිත චක්‍රලේඛයට අනුව ලැබිය යුතු බඩු මල්ල ලැබිලා නෑ කියලා. විශේෂයෙන්ම සීවලි මාවත වාල්ස් පෙදෙස පදිංචි අයට.

**නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මන්ත්‍රීතුමා,අද දිනයෙදි බෙදනවා කියලා මට ප්‍රාදේශිය ලේකම්තුමා කිව්වා.

**03(2) මහා නගර සභා මන්ත්‍රී - එම්. තිසර රසාංජන මෙන්ඩිස් මහතා**

ගරු නගරාධිපතිතුමා, චක්‍රලේකනයට අනුව මේ වන විට හරිනම් රු 5000 බඩුමලු දෙකක් ලැබිය යුතුයි.එවගේම ගරු නගරාධිපතිතුමණි පෙත්සමක් තියෙනවා ඉදිරිපත් කරන්න මොරටුවේ කලාවට විශාල සේවයක් කල නැසිගිය කලාශූරි ටෙනිසන් කුරේ මැතිතුමා වෙනුවෙන් පාරක් නම්කරන්න අපි සියලු දෙනා එකමතිකව නිර්දේශ කර ඒ පිලිබද වැඩ කටයුතු කලා නමුත් හිටපු උප සභාපතිවරයෙක් වන නියුටන් ද සිල්වා මැතිතුමාගේ නමින් තිබු පාරට කියලා ටෙනිසන් කුරේ මැතිතුමාගේ නම යොදලා තියෙන්නේ කිසිදු ප්‍රශ්ණයක් නෑ ටෙනිසන් කුරේ මැතිතුමාගේ නාමයටත් පාරක් නම් කල යුතුයි.වසර 30 පමණ අධික කාලයක් නියුටන් ද සිල්වා නමින් මෙම පාර පාවිච්චි වෙන්නේ මේ පිළිබද ඔබතුමාගේ අවධානය යොමුකොට නියුටන් ද සිල්වා මහතාගේ නමටත් එම පාරටත් සාධාරණත්වයක් ඉෂ්ඨවෙන්නත් ටෙනිසන් කුරේ මැතිතුමාටත් එම නාමය වෙනුවෙන් පාරක් ලබා දිලා මෙ පිළිබදව ක්‍රියාත්මක වන්න කියලා ඉල්ලි සිටිනවා.

**මහ නගර සභා මන්ත්‍රී - යු. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා**

ගරු නගරාධිපතිතුමා, ආයතන හා පෙත්සම් යටතේ මටත් ලියුමක් ලැබිලා තියෙනවා අංක 114 පරණ ගාලු පාර මොරටුව.ඔබතුමාට ඇඩ්‍රස් කරලා තියෙන්නේ සිල්වා මාවත ටෙනිසන් කුරේ මාවත නමින් නම් කිරීමට විරෝධය දැක්වීම සම්බන්ධව.මේක පිටපතක්

**නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මන්ත්‍රීතුමා පිටපතක් ඔබතුමාට කියවන්න බෑනේ.ඔබතුමාට ලියලා තියනවානම් කියෙව්වැකි.අද දිනයේ සභාව ලොකුවෙලාවක් පවත්වන්නේ නෑ ඒක නිසා අනවශ්‍ය විදියට ඔවා ඉදිරිපත් නොකරනවානම් හොදයි.

**මහ නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජීත් පුෂ්පකුමාර මහතා**

ගරු නගරාධිපතිතුමා සභාවේ අතුරු ව්‍යවස්ථාව අනුව එකම කාරණාව දෙදෙනෙකුට කථාකරන්න බෑ තිසර මන්ත්‍රීතුමා කථාකලදේම අනුරසිරි මන්ත්‍රීතුමා කථාකරන්නේ කරුණාකරලා එක නවත්වන්න

<u>නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා.අද දිනයේ සභාව ලොකුවෙලාවක් පවත්වන්නේ නෑ මේ ප්‍රශ්ණත් ඒක්ක පොඩ්ඩක් තේරුම්ගන්න අද මොකක්ද මේ දවස කියලා.මාස 6 කට පස්සේ ඕනෑම දෙයක් කල හැකියි.ගැසට්කරලා තියෙන මාර්ග වලටත් මාර්ග නම්කල හැකියි. ජනතාවගේ කැමැත්ත පමණයි අවශ්‍ය වන්නේ ගාලු පාරට අමරදේව මහතාගේ නම දාලා තියෙනවා. ගාලුපාරට ටිරෝන් ප්‍රනාන්දු මහතාගේ නම දාලා තියෙනවා. විල්ලෝරාවත්ත පාරට විරන්ත ප්‍රනාන්දු මහතාගේ නම දාලා තියෙනවා.සභාවේ කැමැත්ත ජනතාවගේ කැමැත්ත එක සම්මත වෙලා අවසර ගත්තාට පස්සේ පුලුවන්. බැහැයි කියලා දෙයක් නෑ අපි මන්ත්‍රීවරු විදියට දැනුවත් කමක් තියෙන්න ඕනෑ. ඒක නැති නිසා තමයි පෙත්සම් තමන්ගේ අතට එන්නේ.මම කලේ ජනතාවගේ ඉල්ලීම

<u>මහ නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,කොවිඩ් 19 ප්‍රශ්ණය රටතුලත් අප නගරය තුලත් කොළඹ දිස්ත්‍රික්කය තුලත් යනවා නගරාධිපතිතුමා ආසන 5 ජනතාවට ඒන්නත විදපු නිසා අවම වශයෙන් තමයි රෝගීන් අහුවෙලා තියෙන්නේ.මොරටුව කැස්බෑව පිළියන්දල රෝගීන් වැඩිවෙලා කල්දෙමුල්ල අද වෙනකොටත් එන්නත විදලා නෑ ඩොක්ටස්ලා කියලා තියෙනවා මොකක්හරි එන්නතක් දෙන්න කියලා දහම්පුරයි කල්දේමුල්ල මරණ 3 ක් වෙලා තියෙනවා ජනතාව කෝල් කරලා අහනවා ඒන්නත කවදාද එන්නේ කියලා කල්දේමුල්ලට ඉක්මණට එන්නත ලබාදෙන්න. අද කුරිරු යුද්ධය නිමකරලා අවුරුදු 12 ක් වෙනවා මේ වෙලාවේ ත්‍රිවිධ හමුදාව සිහිපත් කරන්න ඕනා.වෙන්න ඔන දේ ඉතා කඩිනමින් කරන්න කියලා සභාවට පැහැදිලි කරනවා.

03(3) <u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, යම් අනතුරක් දරාගෙන මේ මහජන නියෝජිතයින් රැස්වෙලා තියෙන්නේ. ප්‍රමුඛතම කාරණාව වන්නේ ජනතාව මුහුණ දීලා තියෙන කෝරොනා වෛරසය.ගෙවිගිය කාලය තුල අපි සැවොම අඩු වැඩි වශයෙන් මේ ප්‍රශ්ණය මර්ධනය කිරිමෙහිලා ඉටුකල යුතු මහජන නියෝජිතයෝ වශයෙන් අපේ පැත්තෙනුත් වගකීම දරණ රජය පැත්තෙනුත් සිදුවෙමින් තිබෙන කාරණා තුල අප විශ්වාස කරනවා මෙ අනතුර දරණ උත්සාහයන් තුල පරාජය කිරිම අසීරු කාරණයක් විධියට තමයි මතුවෙලා තියෙන්නේ. එනමුදු ඒ අසීරු කාරණාවට මැදිහත්වෙලා ඉන්න වෛද්‍යවරු, PHI මහත්වරු, සේවකයන්ට ගෞරවය ස්තුතිය පළකරනවා. අපි කිසිදු කරුණක් පිළිබඳව වාද විවාද කරන්නේ නැහැ. කොරෝනා සම්බන්ධයෙන් කිසිදු බෙදීමක් නෑ.ඉන්දියාවේ රූප රාමු දකින විට දැවිලා පිච්චිලා යනවා. ඇමරිකා විශ්වවිද්‍යාල තුල පුරෝකථනය කරන විට ලංකාව පිළිබඳ අපට ඇතිවෙනවා සැලකිය යුතු භීතියක්. එනිසා අද අපි කවුරුත් භේද වාද සියල්ල අයින්කරලා මෙය මර්ධනය කිරිමෙහිලා කටයුතු කරන්න ඕනා.

ගරු නගරාධිපතිතුමනි, මම කියාගෙන ආවේ ඔබත් දන්නවා මමත් දන්නවා මේ මහජන නියෝජිතයෝත් දන්නවා අපි කවුරුත් සැලකිය යුතු ලෙස අසරන වෙලා ඉන්න වෙලාවක් අපි කාටත් කලහැකි දේ කරන්න බැරිවන වෙලාවක් රෝගියෙක් නිරෝධානය කරන්න වන අවස්ථාවේ අදාල PHI මහතාට කෝල් එකක් ගන්න දවස තිස්සේම බැරිවෙනවා. මෙය විවේචනයක් නෙවෙයි කිසිදු වැරදි වැටහීමකට ගන්න එපා රෝගී නිවෙසක් පී.සී.ආර්. කරන්න වෙනවා කරන්න ස්ථානයක් හමුවුනත් ප්‍රවාහන පහසුකම් නොමැතිකමින් විශාල අපහසුතාවයකට පත්වෙනවා. අපට හැම කෙනාගේම ජීවිත වැදගත්. ඔබ ක්‍රමවත් වැඩපිළිවෙලකට එන්නත් කිරිම සිදු කලත් එහිත් අඩුපාඩු නැතුවාම නොවේ. සමහර ජනතාව හිතනවා අපිව කන්ඩම් කරලා, අපිට දෙන්නේ නෑ, විවිධ චෝදනා.

එනිසා ප්‍රධාන වශයෙන් සෞඛ්‍ය කාර්යාල එක්කත්, අදාල ප්‍රධානින් සමගත්, ඔබත්, ප්‍රදේශිය ලේකම්තුමත් එවගේම පොලිසියේ එස්.අයි. මහත්තයාත් ඒ ප්‍රධානිනුත් සහිතව වහාම සාකච්ඡා කරලා අඩුම තරමේ කාර්යාංශයක් ස්ථාපිත කරන්න කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු නගරාධිපතිතුමනි, විශේෂයෙන්ම අපි දැනගන්න ඕනෑ අපි නියෝජනය කරන්නේ පක්ෂය. මහජන නියෝජිතයා වෙලා ඉන්නේ පක්ෂවල. ඒ පක්ෂයේ අදහස එක්කෙනෙක් ඉදිරිපත් කරපුවාම හොදටම ඇති කියලා තමයි මගේ අදහස. ගරු නගරාධිපතිතුමා මම කියමින් ආවේ දැන් අපිට අවශ්‍ය මහජන නියෝජිතයෝ ලෙස මේ කොරෝනා වෛරසයට ගෙදුරු වෙලා ඉන්න ජනයා මුහුණ දෙන ගැටලුවලට අවම මැදිහත්වීම සාර්ථක කරන්න. මොන ආකාරයට උත්සාහ කලත් මන්ත්‍රිවරුනි දැන් එ මැදිහත්වීම ජනතාව සතුටුවන ආකාරයේ පිළිතුරක් දෙන්න අපි අසමත්. අපි ඩොක්ටස්ලාට ගන්නවා ආන්සර් කරන්නෑ PHI මහත්වරුන්ට ගන්නවා ආන්සර් කරන්නෑ. මේ ප්‍රශ්ණය ඉතා බරපතල විදියට අපි මුහුණ දිලා තියෙන්නේ ගරු නගරාධිපතිතුමණි. තාමත් මොරටුවේ දත්ත වැඩ කෙරෙන ආකාරය පිළිබදව, දැන් අපිට දිලා තිබිච්ච ලැයිස්තුවට අනුව ඉන්ජෙක්ෂන් එක විදින්න තිබ්බේ ලුනාව රෝහලේ පමණයි. පස්සේ බලන කොට තව තැන් දෙකක මේ ඉදිරිපිට හා එගොඩඋයනේ කණිෂ්යේ. මේ පිළිබදව අපි දැනුවත් නොමැතිකමින් මහජන නියෝජිතයෝ ලෙස අප මුහුණ දෙන අපහසුතා. අපි මොනතරම් අපහසුතාවයට පත් වුනත් කමක් නෑ රෝගය පාලනය කිරිමට රෝගය සම්බන්ධව යන සටන හොදට යනවානම් අපි තෘප්තිමත්. අපිටත් එහි දායකත්වයක් ලබාදෙන්න තියෙන අවස්ථාව අහිමි වෙනවා.එ නිසා මාගේ යෝජනාව තියෙන්නේ ඔය සියලු කාරණා පසෙක තියලා ඉන්දියාව මුහුණ දිලා ඉන්න තත්වයට අපි මුහුණ දෙන්න වුනොත් අපිට ලෙසි වෙන්නේ නෑ. ඉතාම අසීරු තත්වයකට පත්වෙනවා. මේ මොහොත වෙන කොට මන්ත්‍රිවරුණි ආර්ථික වශයෙන් වැටිලා ඉන්න ජනතාවගේ කෝපයත් එන්න එන්නම උත්සන්න වෙමින් තියෙනවා. රෝගය උත්සන්න වෙනවාට සමානව ජනයාගේ කෝපය කේන්තිය උත්සන්න වන බව පෙනවා. සමහර බේරන්න පුලුවන් ගැටලු බේරන්න බැරිවෙනවා. ඔවුන්ගේ කෙන්තිය හා ඒ කේන්තිය හරහා කරන හැසිරිම නිසා. එනිසා මම කියන්නේ මොරටුව ආසනය විදියට ඔබතුමාට පැවරිච්ච කාර්ය්‍යය මුලික මෙහෙයුම් කාර්ය්‍යංශයක් ඕනා. කෙනෙකුට කථා කලාම උත්තරයක් දෙන තැනක් ඒ වගේම නිරෝධායන බෝඩ් එක අලවන්න එකපාරක් කිව්වාම ඇති. දැන් නිරෝධාන බෝඩ් එක අලවන්න දවස් ගානක් බලන් ඉන්නවා. එතකොට කොහෙමද රෝග ව්‍යාප්තිය වලක්වා ගන්නේ. අපි මොනවා කථා කලත් වැඩක් නෑ ඉදිරිපිටට එනකොට ඔබ වර්ණනා කරලා ගහන කවි මොකටද? මේවන කොට 30 කට ආසන්න ප්‍රමාණයක් ජීවිත අහිමි වුනා. මොරටුවේ දහස් ගානක් රෝගින්. මෙතනින් ඔබ්බට අපිට කිසිම සාකච්ජාවක් නෑ. මම කියන්නේ ඔබට මොකක්හරි ක්‍රමයකින් දැන් අරයා ලොකුද මෙයා පොඩ්ද මෙයා පොඩ්ද එයා ලොකුද අපිට අදාල නෑ නගරාධිපතිතුමණි. අපිට කියන්න දෝස්තරලාට දනින් වැටෙන්න ඕනානම් අපි දනින් වැටෙන්නම් මහජන නියෝජිතයෝ ලෙසත් මහජනතාවට සේවය කරන වෛද්‍යවරු ලෙසත් අපි කවුරුත් එක මතයකට ඇවිල්ලා වැඩ කරන්න පුලුවන් භුමිකාවක් කරමු කියලා තමයි අපේ පැත්තේන් ඉල්ලන්නේ. අපි අන්ත අසරණ වෙලා ඉන්නේ. අසරණ වෙන්නේ නෑ අපිටත් පුලුවන් මේක කියන්නැතිව මේකෙන් ආරක්ෂා වෙන්න ගෙදරට වෙලා ඉන්න. හැබැයි ඒකද අපේ යුතුකම ඒකද අපේ වගකීම ඔබ කවුරුත් මේ තත්වයට මුහුණ දලා ඇති කියලා මම හිතනවා.මම CPHI ට 11 වතාවක් ගන්නවා මට අහගන්න තියෙන උපදෙස් අහගන්න කෙනෙක් නැත්නම් මම මේක මෙතන කියන්න ඕන නැද්ද මේ ප්‍රශ්ණෙට අපි කාටත් කිසිම ආකාරයක බෙදිමක් නැතිව අපිටත් එ අවස්ථාව අහගන්න යම් තැනකට කථාකලාම උත්තරයක් ගන්න පුලුවන් තැනක් හදන්න.මොරටුවේ ඇත්ත තත්වය පිළිබද අපිට නිශ්චිත පිළිතුරක් ගන්න පුලුවන් තැනක් හදන්න ව්‍යාප්ත වන්නේ කොහෙද කියලා ජනතාවට දැනගන්න පුලුවන් තැනක් හදන්න.එ අදාළ තොරතුරු ඉතා හොදින් පහලට අරගෙන ගියොත් හැමෝම පරිස්සම් වෙයි.හැමෝම

ආරක්ෂාවෙයි.හැමෝම ස්වෙච්ඡාවෙන් මේ කටයුත්ත කරයි.එනිසා ගරු නගරාධිපතිතුමණි අද දවසේ මෙ ප්‍රකාශය නිකම්ම ප්‍රකාශයක් ලෙස වාතලයට එකතුවෙනවා නම් ඒක වැඩක් නෑ.එනිසා අද මේ සභාවේ මේ අමාරුකම් මැද්දේ මහජන නියෝජිතයෝ ඇවිල්ලා කරන සාකච්ඡාව ඇතුලේ මොරටුව ජනතාවට ඇහෙනවා නම් මෙම රැස්වීම ප්‍රමුඛ වුනේ ඔවුන්ගේ ජීවිත ආරක්ෂා කරගන්න විධිය සාකච්ඡා කරන්න. අන්න අපිට  හෙට කථා කරන්න තොරතුරු අහගන්න පුලුවන් අන්න තැනක් තියෙනවා අන්න වගකීමක් තියෙනවා. එහෙම නැත්නම් අද මේ ඇවිල්ලා එළියට යන්නේ අර වගකීම පරණ තැනටම තියලා නම් මොකටද අපි ඇවිල්ලා. එනිසා කොහොමද කරන්නේ කියලා අපි සාකච්ඡා කරමු.

03(4) <u>මහ නගර සභා මන්ත්‍රී  - එෆ්.බී. නිලංක සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, තවත් ආයාචනයක් කලයුතුව තිබෙනවා. ප්‍රථමයෙන් මම ඉතාමත් එකගවෙනවා ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා කියූ අදහසුත් එක්කම එහිදි නොකියූ කොටසක් තමයි මම මේ කියන්න හදන්නේ.යම් පවුලක් යම් පුද්ගලයෙක් මේ කාල වකවානුවේ ඔවුන් කොවිඩ් රෝගය නොවැලදවුනත් ඔවුන් නිරෝධානය කරන පවුලක් බවට පත්විම තුලදිම ඔවුන් දෙයාකාරයකට මානසිකව වැටෙනවා.ජීවනොපාය අහිමිවිම නිසා අනෙක් එකතමයි කොවිඩ් රෝගයට ගොදුරු වෙයිද කියන භය නිසා ඔවුන් දෙයාකාරයකින් මානසිකව වැටෙනවා.එ අවස්ථාවේදි මහජන සෞඛ්‍ය පරික්ෂකවරුන් ඔවුන්ගේ නිවසට ගිහිල්ලා නිරෝධායනය කලායින් අනතුරුව දවස් 4 ක 5 ක කාලයක් යනවා සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාලය තුලින් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට නිර්දේශ කරලා යවන්න.මානසිකව හා ආර්ථිකව වැටිලා ඉන්න පවුලට බඩුමල්ල හෝ ලැබිමේ අවස්ථාව දවස් 4 ක කාලයක් අහිමි වෙනවා.මම කියන්නේ සෞඛ්‍ය අංශ නිර්දේශ කරනවානම් පි එච් අයි නිර්දේශ කරනවානම් නිරෝධානය වුන පවුලක් කියලා අදාල කොට්ඨාශයේ ග්‍රාම නිළධාරිතුමා ඉන්නවානම් ප්‍රාදේශිය ලේඛම් කාර්යාලයේ මේ නිවස හරි මේ ග්‍රාම නිළධාරි කොට්ඨාශයේ තියෙනවා කියලා ඇයි අපි මේක අතර මැදි තැනකට ගෙනියලා දවස් හතරක් හෝ පහක් ප්‍රමාද කරන්නේ මේ මිනිස්සුන්ට සහනය සලසන්න මම කියන්නේ මේක ඔබතුමන්ලා කථාකරලා අවශ්‍ය ස්ථානත් එක්ක කථා කරලා මේ යාන්ත්‍රනය හදලා ඉතාමත් ඉක්මණින් මේ ජනතාවට සහනය ලබාදෙන්න කටයුතු කරනවානම් ඉතාමත්ම හොදින් මෙම තත්වය පාලනය කරලා එ ජනතාව නිවෙස්තුලටම රදවලා තබාගැනිමේ හැකියාව අපිට ලැබෙනවා එ ලැබෙන්නා වූ සහන මල්ල ලබා දුන්නොත් ඉක්මණින්.නැත්නම් ඔවුන්ගේ ආර්ථිකය වැටිම නිසා ඔවුන් යම් යම් තැන්වලට යන්න උත්සාහගන්න තත්වයක් අපි දකින්න ලැබෙනවා.එ නිසා ඔබගේ දැඩි අවධානය යොමු කරලා යම් තැන්වල තියෙන්නාවූ අවහිරකම් දුරලාලා ජනතාවට මෙ අවස්ථාව ලබාදෙනමෙන් ඔබෙන් ආයාචනා කරනවා.

03(5) <u>මහ නගර සභා මන්ත්‍රී  - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමා විශේෂයෙන්ම පවතින වසංගත තත්වය බෝහොම දරුණු අතට හැරිලා තියෙන අවස්ථාවක අපි පහුගිය මාස කිහිපයකට ඉහතදි මේ පලවෙනි රැල්ලේදි එක සාර්ථකව මුහුණ දුන්නා රජයටත් අපි එ වෙලාවේ ස්තුතිය ප්‍රකාශ කරනවා. පලවෙනි රැල්ලේදි නගර සභාවක් විධියට අපිත් එකරාශිවෙලා අපිටත් පුලුවන් උපරිම දායකත්වය ලබලාදිලා ඒ සහයෝගය ලබලා දුන්නා තමුන්නාන්සේලාත් එක්ක එකතුවෙලා සියලුම මහජන නියෝජිතයන් අද වෙනකොට දෙවෙනි රැල්ල ඇවිල්ලා දෙවෙනි රැල්ලේන් තුන්වෙනි රැල්ල ඇවිල්ලා මේකේ වගකීම එක එක්කෙනාපිට පටවන අවස්ථාවකට පත්වෙලා තියෙනවා. විශේෂයෙන්ම ජනතාවගේ පැත්තේනුත් යම්කිසිදාක් දුරට වැරදි සහගතයි.නමුත් ආණ්ඩුවක් විධියට ගත්තාම අපි නිශ්චිත කියාමාර්ග ගත්තාද කියලත් ප්‍රශ්නයක්

තියෙනවා. එනිසා එ තත්වය අපි අදවෙනකොට අත්විදිමින් ඉන්නවා භයානක තත්වයකට. විශේෂයෙන්ම එදා මොරටුවේ එක්කෙනා දෙන්නා දකින කොට පොසිටිව් වෙනකොට අපිට ලොකුදෙයක් විධියට දැණුනා අද අපියන සමහරක් මරණ ගෙවල්වල එ මරණය පොසිටිව් වෙලා තියෙනවා ගේ ඇතුලට යන්නැතිව අපි එළියේ බලන් ඉන්නවා. පෙරේදා වෙනකොට මොරටුවේම මම දැණුවත්ව දෙකක් නැත්නම් තුනක් වුනා.මෙ දවස් ටිකේ දිගින් දිගටම වෙනවා.අපිත් මෙවට සහභාගිවෙනවා.ඉතින් එක නිසා මේකේ අපි දකිනවා දරුණුතම තත්වය පිළිබඳ විශේෂයෙන්ම මේකෙදි අපි දකින්නේ අද තමුන්නාන්සේලා නියෝජනය කරන කොට්ඨාශ තුල විල්ලෝරාවත්ත කොට්ඨාශයේ අදවෙනකොට දවස් 15 කට ලන්වෙලා තියෙනවා. මෙ වෙනකොට මේ ක්‍රමය සකස් කරලා තියෙනවා කියලා ආරංචියක් ලැබෙනවා. අද උදේ වෙනකොට මට වාල්ස් පෙදෙසේ සීවලි මාවතෙන් ආරංචිවෙනවා දවස් 7 න් ලැබෙන්න තියෙන බඩුමල්ල දවස් 15 ගිහිල්ලා අදයි ලැබෙන්නේ කියලා. මේ වෙනකොට විල්ලෝරාවත්ත කොට්ඨාශයට දෙපාරක් ලැබෙන්න ඕනැ අවස්ථාවක් විශේෂයෙන්ම අපි දැක්කා ඊයේ රූපවාහිනිය තුල බන්දුල ගුණවර්ධන මහතා බඩුමල්ලක් පෙන්නනවා එ බඩුමල්ල මම නෙමෙයි දකින්නේ මුලින්ම මම ටිවි එක රිවයින් කරලා බැලුවේ විල්ලෝරාවත්ත කෙනෙක් මට කථා කරලා කිව්වා මේ බඩුමල්ල දිහා බැලුවාම අපිට ලැබුන්නැ කියලා එවගේ බඩුමල්ලක්.මේක අපි නෙවෙයි.බන්දුල ගුණවර්ධන මහත්තයා ටීවී එකේ පෙන්නපු බඩුමල්ල.

<u>මහ නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,බන්ධුල ගුණවර්ධන ඇමතිතුමා පෙන්නපු බඩු මල්ල තාම කාටවත් දීලා නෑ.

<u>මහ නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,ජනතාව තමයි බලාපොරොත්තු වෙන්නේ මේක තමයි දෙන්න තීරණය කළේ ඒත් ලැබුණේ මේකයි කියලා. ඒක නිසා ඉදිරියේදී ලබා දෙන කොට ඒ වගේ බඩු මල්ලක් ලබා දෙන්න කටයුතු කරන්න.

<u>නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඒ බඩු මල්ලෙයි දීපු බඩු මල්ලෙයි අපි නෙමෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයයි දෙන්නේ. පැහැදිලිවම කිරි පිටි නෑ, පොල් තෙල් නෑ, පොල් නෑ. විසි එකක් තියෙනවා දීපු එකේ. බන්ධුල ගුණවර්ධන ඇමතිතුමාගේ බඩු මල්ලේ විස්සයි. විස්සෙත් අවශ්‍ය කරන විදියට නෙමේ බඩු මල්ල දීලා තියෙන්නේ. දීපු බඩු මල්ල අවශ්‍ය විදිහයටයි දීලා තියෙන්නේ. මිනිස්සු ස්තුතිවන්ත වෙනවා. සමහර අය ඉතිං කොහොමත් අඩුපාඩු දකිනවානේ. බුදුහාමුදුරුවන්ගෙත් දැක්කා. ජේසුස් වහන්සේගෙත් දැක්ක ලෝකෙකනේ අපි ජීවත් වෙන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,එහෙම වෙලා තියෙන්නේ ඔබතුමා නියෝජනය කරන කොට්ඨාසය තුළ. ඔබතුමාටත් ඇඩි වගකීමක් තියෙනවා. මම කියන්නේ නෑ වගකීම පැහැර හරිනවා කියලා. දෙපාර ලබා දෙන්න. අන්ත අසරණ තත්ත්වයට පත් වෙලා තියෙනවා. සමහරක් අයට. මෙකේදී නීතිමය පැත්තම බලන්න එපා නගරාධිපතිතුමා. එක පවුලක් කථා කරලා කිව්වා. උදාහරණයකට. පැන්ෂන් එක ගෙදරට ලැබෙනවා. රු. 19,000/- යි ලැබෙන්නේ. රු. 16,000/- ක් ගාණක් යනවා නිවාස ණයට ගෙවන්න. රු. 2,000/- ගාණයි ඉතිරු වෙන්නේ. තවත් අනු පවුලක් ඉන්නවා දුව ඉන්නවා. ඒත් දුවට ලැබෙන්නේ නෑ. අන්න ඒ වගේ පවුලුත් ඉන්නවා මේ කොට්ඨාසය තුළ. සීමාවකින් තොරව ගිහිල්ලා ලබා දෙන්න පුළුවන් අවස්ථාවලදී ලබා දෙන්න කියන ඒ ඉල්ලීම කරනවා. මේ ව්‍යසනය තුළ

අපි දැක්කා සෞඛ්‍ය අංශත් එක්ක මේක දේශපාලනයෙන් විතරක් නෙමෙයි. එක කෝණයකින් විතරක් නෙමෙයි. මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුත් එක්ක එකතු වෙලා, සෞඛ්‍ය අංශත් එක්ක එකතු වෙලා ආරක්ෂක අංශත් එක්ක එකතු වෙලා රජයත් එක්ක එකතු වෙලා තමුන්නාන්සෙලා කටයුතු කරන්න කියල ඉල්ලීම කරනවා. අපි එක පැත්තක් බෙදිලා කටයුතු කළොත් තව පැත්තක් කඹ අදිනවා. ඊයේ දැක්කා හොඳාකාරවම යම් යම් නිලධාරින් අපි එක්ක පැවසූ දේවල් වලින්. මේ තත්ත්වය ක්‍රමානුකූලව කරගෙන යන්න. අපි මොරටුවක් විදියට යන එකතුවෙලා කරන ගමනක් තියෙනවානම් ඒ අයත් එක්ක එකතු වෙලා අපිත් මේකට සහයෝගය ලබා දෙනවා කියලා ඉල්ලීම කරනවා.

**03(6)** **මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා**

ගරු නගරාධිපතිතුමා,පොඩි ගැටළුවක් සම්බන්ධයෙන් ඔබතුමා දැනුවත් කරන්න. කොවිඩ් වලින් මැරුණාම යම් කෙනෙක් ඒ මිනිස්සු ලොකු අපහසුතාවයකට පත් වෙනවා ඒ බොඩි එක ගෙනල්ලා ආදාහනය කිරීම සම්බන්ධව මම ස්තූතිවන්ත වෙනවා ඔබතුමාට තෙලවල ප්‍රදේශයේ මරණයක් සම්බන්ධයෙන් ඔබතුමා මැදිහත්වීමෙන් ගැටළුවක් නැතිව කර ගන්න පුළුවන් වුණා. දැන් මේ කොරළවැල්ල ප්‍රදේශයේ මරණයක් වෙලා 14 වෙනිදා මැරිලා තියෙන්නේ තාමත් පානදුර රෝහලේ තියෙන්නේ. ඊයේ ඔබතුමාවත් දැනුවත් කළා ඒ සම්බන්ධයෙන්. ඇම්බියුලන්ස් එකක් නැතුව ඉන්නවා බොඩි එක ගේන්න. ගරු නගරාධිපතිතුමා මේ සම්බන්ධයෙන් ඉහළට දැනුවත් කරලා මේකට මොකක්හරි විසඳුමක් දෙන්න. තාමත් ඒ මිනිස්සු එහෙට යනවා මෙහෙට යනවා. සමහර වෙලාවට මේ මිනිස්සුන්ටත් තියෙනවාද දන්නෑ කොවිඩ්. මොකද එක ගෙදර හිටපු මිනිස්සු. නමුත්, ඒ මිනිස්සුන්ට එළියට යන්නේ නැතුව මිනිය වළදා ගන්න විදිහක් නෑ. ලොකු අනතුරක් තමයි වෙන්නේ ඒ මිනිස්සු ඇවිදිනවා කියන්නේ. ඒ නිසා මොනවහරි ක්‍රියාමාර්ගයක් ගන්න කියලා ගෞරවනීය ඉල්ලිම කරනවා.

**03(7)** **මහා නගර සභා මන්ත්‍රී - එච්. ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා**

ගරු නගරාධිපතිතුමනි, ඉතාම භයානක බේදජනක තත්ත්වයකට රට මුහුණදීලා ඉන්න වෙලාවේ මොරටුව මහා නගර සභාව විදියට සීමාවන්ට අනුව අපි රැස්වෙලා ඉන්නේ මේ කාරණය පිළිබඳව පුළුල්ව කථා කළයුතු අවස්ථාවක. ගරු නගරාධිපතිතුමනි, අපි මතක් කර ගන්නට ඕනෑ ගරු විපක්ෂ නායකතුමා මතක් කළා වගේ පළවෙනි රැල්ල ආපු වෙලාවේ මේ රට ඒකට හොඳින් මුහුණ දෙනවා. විශේෂයෙන්ම මොරටුව නගරය ගත්තම ගරු නගරාධිපතිතුමනි, අපි ඒකට මොරටුව මහා නගර සභාව විදිහටත් අපේ මැදිහත්වීම දීලා දැනුවත් කිරීම් කරලා විශාල කාර්ය භාරයක් කළා. ඒ වෙලාවේ ගරු නගරාධිපතිතුමනි මතක් කර ගන්න ඕනෑ අපි සමහර වෙළඳසැල් ජනතාව ගැවසෙන ස්ථාන වලට අපි දැනුම්දීම් කරලා විවිධ උපක්‍රම පාවිච්චි කළා. ඒවා සාර්ථක වුණා. සින්ක් එකක් සූදානම් කරන්න, සැනිටයිසර් පාවිච්චි කරන්න. නම ලියන්න. ඒත් අද වෙනකොට ගරු නගරාධිපතිතුමනි, මේ තරම් භයානක තත්ත්වයකට ගිහිල්ලා තියෙන වෙලාවේ ඒ පුරුදු අත් හැරිලා තියෙන ගතියක් අපිට පේන්න තියෙනවා. මොරටුව නගරය දිහා බැලුවම ඒ වෙළඳසැල්වල මෙච්චර භයානක නැති පළමු රැල්ල වෙලාවේ හයි කරලා තිබුණු සින්ක් එක අද නෑ. සැනිටයිසර් නෑ. උෂ්ණත්වමානක නෑ. නම් ලියන්නේ නෑ. රිසි සේ ජනතාව ගැවසෙනවා. ඒක නිසා ගරු නගරාධිපතිතුමනි, නගර සභව විදිහට අපි වහාම මැදිහත් වෙන්න ඕනෑ මේ කාරණය පිළිබඳව ව්‍යාපාරිකයන් හා ජනතාව දැනුවත් කරලා ඒ කටයුතු කරන්න. ඒ වගේම ගරු නගරාධිපතිතුමනි, මම විශේෂයෙන්ම ස්තූතිවන්ත වෙනවා නිශාන්ත ප්‍රදිනාන්දු මැතිතුමාට වෙනදා මොන කාරණා සම්බන්ධයෙන් වාද විවාද තිබුණත් මේ කාරණය සම්බන්ධයෙන් එතුමා සාධනීයව පරිණත දේශපාලන දැනුම පාවිච්චි කරලා ඉතා සංවේදීව මේ කාරණය දිහා බලපු විදිහ. අපි තව කාරණාවක් මතක් කර ගන්න ඕනෑ මේ එන්නත් කරන

වැඩසටහනේ පහුගිය කාලය පුරාම විවිධ ප්‍රශ්න තිබුණා. ගැටළු තිබුණා. විශේෂයෙන්ම අපි මාධ්‍යවල දැක්කා පොර කමින් ජනතාව පීඩාවට පත්වෙමින් එම එන්නත් ලබා ගන්නවා. ඔබතුමාගේ නායකත්වයෙන් මැදිහත්වීමෙන් ඊයේ දිනයේදී එන්නත්කරණය කළා මහා නගර සභාව ඉදිරිපිට කොට්ඨාස දෙකකට. ඒ වෙලාවේද ලුනාව රෝහලේ එන්නත්කරණය සිද්ද වුණා ඔබතුමාගේ පාලනයකින් තොරව. හැබැයි ඒ දෙක අතර, විශාල පරතරයක් තිබෙන බව අපි ඇහින් දුටුවා. අපිටමිනිස්සු කිව්වා. අපි මාධ්‍යවල දැක්කා. මම සමාජ මාධ්‍යයේ දැක්කා අපේ මහජන නියෝජිතයෝ පළ කරනවා සමහරු එතනට ගිහිල්ලා ඒ අඩුපාඩු පිළිබද ඉතා කුහක විදිහට කථා කරනවා. හැබැයි මෙතනට ඇවිල්ලා මෙතන තියෙන ක්‍රමවත්භාවය පිළිබදව ඇහක් ඇරලා බලන්න ඔවුන් උත්සහ කළේ නෑ. ඒකනිසා ගරු නගරාධිපතිතුමනි, අපි කොහොම වුණත්, අපි ඔබතුමාට කියනවා අපේ තැන විතරක් නෙමෙයි අනෙක් තැනත් නිවැරදි කර ගන්න මැදිහත්වීමක් ඔබතුමා කරන්න අපේ සහයෝගය අපි ඔබතුමාට ලබා දෙනවා. විශේෂයෙන්ම ඊයේ දිනයේ වැඩ පිළිවෙල පිළිබදව ඔබතුමාට, විශේෂයෙන්ම මැදිහත්වෙච්ච නාගරික කොමසාරිස්තුමාට ඔබතුමාට විශාල ශක්තියක් දුන්නා. එතුමා තරුණ නිලධාරියෙක් විදිහට මම හිතන්නෙ පුදුම කැපකිරීමක් කළා. ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා ප්‍රමුඛ සියලුම මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් නිශාන්ත ප්‍රදීනාන්දු මන්ත්‍රීතුමා කියනකොට මට මතක් වුණේ එතුමාට දුරකථන ඇමතුම් එකොළහක් ගත්තා ආන්සර් කරන්න බැරි වුණා කිව්වම මට මතක් වුණේ එතුමා ඊයේ දවසේම කළේ එන්නත්කරණය. එතුමා සහ අපේ මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරු තමයි ඊයේ එන්නත්කරණයට සම්බන්ධ වුණේ. අපි ඒ කාරණයට මැදිහත් වුණ නිසා දන්නවා වෛද්‍යවරයෙක් මේ කාරණයට සම්බන්ධ කර ගන්න කොයි තරම් අපහසු වුණාද කියලා. ඒකට නිලධාරියෙක් සම්බන්ධ කර ගන්න කොපමණ අපහසු වුණාද කියලා. රවිනාත් ගුණසේකර හිටපු නගරාධිපතිතුමා මේක දැහින් දැක්කා. අපේ නිලධාරින් පුදුම කැපවීමක්, අපේ කාර්ය මණ්ඩලයේ පුදුම කැපවීමක් ඒ නිසා අපේ ලේකම්තුමා ඇතුළු සියලු දෙනාට මොරටුව මහා නගර සභාවේ සියලු දෙනාට අපගේ ගෞරවනීය ස්තූතිය පුද කරන ගමන් නැවත වතාවක් ගරු නගරාධිපතිතුමනි, මොරටුව මහා නගර සභාව විදිහට අපගේ මැදිහත්වීම මීට වඩා ලබා දිය යුතු නම් ඒ අවශ්‍ය හැම තැනකටම මැදිහත් වෙන්න කියලා ඉල්ලීම කරමි.

**03(8)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. සුනිල් නන්දසිරි මාසකෝරාල මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මෙහෙම දෙයක් වෙනවා. ජයවර්ධනපුර රෝහලේ රුපියල් පන් දහසක් අරගෙන පී.සී.ආර් කරනවා පී.සී.ආර් එක කරලා මම පෙරේදා ඔබතුමාත් එක්ක කථා කළෙත් ඒකයි. පී.සී.ආර් එක කරලා පී.සී.ආර් පොසිටිව් වුණාට පසුව ගෙදර යන්න කියනවා. ඒ මිනිස්සු බස්වල ගෙදර එනවා. රනිල් උදාහරණයක්. ඉදිබැද්දේ ජයසිරිලා ඒවගේ කිහිපදෙනෙක් සකස් කරන්න. ඒ නිසා බැරිද ඒ ප්‍රශ්නය අඩු කරන්න හරි නැති කරන්න හරි මොනවාහරි ක්‍රමයක්. හොදාකාරවම දන්නවා රනිල්ලාගේ ගෙදර 4 වන පටුමගේ ඒ වගේ දේවල් සෞඛ්‍ය ආරක්ෂිතව නැතිව කිසිම වැඩ පිළිවෙලක් නැතුව තමයි ඒ වගේ දේවල් කරන්නේ. ඒක ලොකු වරදක්. රෝහලෙන් පී.සී.ආර්. එකක් කරලා රුපියල් පන් දහසක් අරගෙන ගෙදර එවනවා යන්න කියලා. ගෙදර ඇවිල්ලා අපිට කථා කරනවා ලොක්ඩවුන් වෙන්න ඕනෑ කියලා. ගොඩක් වෙහෙසෙන පුද්ගලයෙක් තමයි අපේ ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා. ලොක්ඩවුන් කරලා දවස් දහය පහළොව ගියාට පසුව හොදම උදාහරණය තමයි අපේ බ්‍රෙන්ඩන්. අපිත් එක්ක ඡන්දෙ ඉල්ලපු බ්‍රෙන්ඩන් අද උදේ එයාට කියලා කොළය ගලවලා අයින් කර ගන්න කියලා. දවස් 18 ක් අදට ඒ පවුලේ කට්ටිය. ඒ වගේ ලොකු ව්‍යසන වෙනවා. අන්තිමට දේශපාලන අධිකාරිය හරහානේ යන්නේ. ප්‍රධානියා වෙන්නේ ඔබතුමා. ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාත් හැල්ලුවට ලක් වෙනවා තවත් අය ගිහිල්ලා වැඩේ කරන්නේ නෑ. ඒක කරන්න එපා. රෝහලෙන් ලොකු වරදක් කරනවා. එනකොට බස් එකේ හරි ත්‍රීවිල් එකේ හරි

එනවා. දැන් දෙන්නෙක් ලොක් ඩවුන්. එහෙම කරන්න එපා. පුවක්අරඹ හන්දියේ වෙච්ච මරණය විල්ලෝරාවත්තේ අපේ සුමිත්ලගේ මරණය ඒත් ඒ වගේ. ඒ මරණයට ඇඳුම් අරන් දෙන්න වුණේ මට ගිහිල්ලා. ස්තුතිවන්ත වෙනවා ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාට ඒ ගියාම කවුරුවත් ගණන් ගන්නේ නෑ. ඒ මිනිස්සුන්ට ඇඳුම් ගන්න යන්නත් බයයි. ලොක්ඩවුන් කරලා කොළේ අලවලා ගියාට පස්සේ ත්‍රීවිල් එකක් එන්නේ නෑ. යන්නත් බෑනේ. ඒගොල්ලෝ ඊට පස්සේ පයින් ගිහිල්ලා මොරටුමුල්ල හන්දියෙන් ත්‍රීවිල් එකක් අරගෙන ගිහිල්ලා මරණේ කටයුතු කරලා ඊට පස්සේ එහෙන් ත්‍රීවිල් එකක් අරන් ගෙදර එනවා. බස් එකක් ගියාම කොහේද ගියේ කියලා කැමරා චෙක් කරලා මුළු ලංකාව වටේම හොයනවා. ඒක තමයි හරි. ඒත් දැන් වෙන්නේ ඒක නෙමේනේ. ඒක නිසා කරුණාකරලා ඉල්ලීමක් කරනවා අපේ ප්‍රදීප් ශ්‍රියන්ත මන්ත්‍රීතුමා කිව්ව වගේම මහා ව්‍යසනයක් මේක. දැන් ඔය දඟලන අපේ එම්.ඕ. එච් මහත්තුරුන්ට කියන්න. අන්තිමේට අතගහන්න වෙන්නේ නගර සභාවේ කෙනෙක්ට. රනිල්ලා ජයසිරිලව ගන්න උදාහරණේට. අපේ සුමිත්ලගේ මල්ලිව ගන්න හැමෝටම උනේ ඒ වගේ. සහභාගී වූ නිසා මම දන්නවා ඒ වට සහභාගි වූ නිසා ඒක හරි ප්‍රශ්නයක්. සන්ක්‍රිස්තියන්ගේ මරණයට ඉස්සරවෙලා මරණ දෙකක් වුණා. දෙකම පොසිටිව්. ඉදිබැද්දේ පොඩි මහින්දලාගේ මරණයත් 2 පටුමගේ මරණයත් ඒ දෙකටම මම තමයි මරණ පරීක්ෂකතුමාව එක්කන් ආවේ. අශෝක් පුවක්ගහතොටුපලේ ඊයේ කරේ. මට නම් හිතා ගන්න බෑ. ඇත්තටම වාසනාවන්ත වුණා අපේ සංක්‍රිස්තියන් මාමා 105 ක් වුණාට හැමෝම බලන්න ඇවිල්ලත් කොවිඩ් නෑ. ඒත් කොහේවත් ඉන්න අය මරණ පරික්ෂකතුමාත් එක්ක තර්ක කරනවා මේක වෙන්න බැරි වැඩක් කියලා. රනිල්ලට ඔබතුමා ගොඩක් උදව් කළා. දෙන්නම පී.සී.ආර්. කරලා ඇවිල්ලා තියෙන්නේ බස් එකේ. ඒ ප්‍රශ්නෙත් තියෙනවා. තව ලොක් ඩවුන් වුණාම මරණයක් වුණාම පව් නේද මෙලෝ හසරක් නැති මිනිස්සු. රුපියල් අටසීයක් දීලා ගන්න ඕන. වාහනයක් හරි ලෑස්ති කරලා දෙන්න නගර සභාවෙන් පිං සිද්ධ වෙනවා. ඒක ලෑස්ති කරලා දෙන්න. නැත්නම් මහා ව්‍යසනයක් වෙන්නේ. අපිත් ආරක්ෂා වෙන්න ඕනනේ. මොරටුමුල්ලට ගිහිල්ලා ත්‍රීවිල් එකක් අරන් කළුබෝවිලට ගිහිල්ලා මෝචරියට ගිහිල්ලා ඒ කටයුතු කරලා ආයිමත් ත්‍රීවිල් එකක් අරන් ගෙදර එනවා. මේ සත්‍ය කථාවක්. ඒක නිසා කරුණාකරලා මේ සම්බන්ධව අවශය කටයුතු සිදු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**03(9)** **<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමා, ප්‍රායෝගිකව නිරෝධානයට මුහුණ දුන්න කෙනෙක් හැටියට පොඩි ඉල්ලීමක් කරන්න කැමතියි. සුළු සේවකයන්ගෙන් ඉඳන් මන්ත්‍රීවරු දක්වා කවුරුහරි නිරෝධායනය වෙනවානම් වගකීමක් හැටියට යුතුකමක් හැටියට නිරෝධායනය වෙනවා කියන්නේ ප්‍රායෝගිකව මුහුණ දෙනකොට තමයි ඒකේ අමාරුව තේරෙන්නේ. කොච්චර මානසිකව වැටෙනවාද කියලා. මගේ පෞද්ගලික අත්දැකීමක් හැටියට මාගේ ගැණු දරුවා පොසිටිව් වෙච්ච බව ආරංචි වෙච්ච හැටියෙම මම බැලුවා ලුනාව රෝහලට දාන්න පුළුවන්ද කියලා ළඟම තැන. ඒත් අවස්ථාවක් ලැබුණේ නෑ. මගේ ගැණු දරුවාව අරිනවා මීගමුවට. කවුරුවත් නැති තැනකට. දෙවැනි දවසේ ඒ ළමයා හුස්ම ගන්න බැරුව අඬනවා. මගේ මානසිකත්වය. මෙතනින් අඩුම ගානේ මානුෂීය වශයෙන් මන්ත්‍රීතුමිය මොකක්ද වෙන්න ඕනෑ එහෙමවත් ශක්තියක් දෙන්න තියෙනවානම්. මට විතරක් නෙමෙයි. මීන් ඉදිරියටවත් මේක වෙන්න පුළුවන් මානුෂිය පැත්තෙන් හිතන්න ඕනෑ කියලා මම ඉල්ලීමක් කරනවා. නීරෝධායනය වෙලා දවස් 07 වෙනකම් ප්‍රාදේශීය ලේකම් හෝ ග්‍රාමසේවක දන්නේ නෑ මම නිරෝධානයනය වෙනවා කියලා. මම අහනකොට කියනවා ඔබතුමියගේ නම සඳහන් නෑ. අපේ මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරු හරි බිසී මම දන්නවා ඇත්තටම. ඒ ගොල්ලන් තොරතුරු දීලා තියෙනවා. ඒවා හරි තැනට යන්නේ නෑ. තවත් දවස් 07 කට පසුව තමයි මට බඩු මළු ටික ලැබෙන්නේ බඩු මළු ටික ලැබුණා හරි නැතා හරි අපිට මොකක් හරි කර ගන්න පුළුවන්. අසරණ දුගී කට්ටියට මොනවගේ තත්ත්වයක් උදා වෙයිද? ඒ නිසා අපි ආයතනයක් හැටියට සුළු සේවකයින්ගේ

සිට මන්ත්‍රීවරු දක්වා කවුරුහරි නිරෝධායනය වෙනවද යන්න සොයා බැලීමට ක්‍රමවේදයක් අපි හදා ගත්තොත් හොඳයි. මොරටුවේ අපි කට්ටිය කවුරුහරි පොසිටිව් වුණොත් ඈත පළාතකට යවනවා. ගෑණු දරුවෝ යවනවා. ඉන්න බෑ. අම්මා කෙනෙක් හැටියට මම එහෙම මුහුණු දුන්නානම්. අනිත් අම්මලා කොහොම දුකක් විඳිනවා ඇද්ද. කරුණාකරලා අපිට පුළුවන්නම් මේ වගේ තැනක මෙහෙම කරන්න කියලා දෙවන ඉල්ලීම. ඉන්ජෙක්ෂන් දෙනවානම් මෙතන සූදානම් කරලා සභාවේ කට්ටියට හා පවුල් වලට මෙතනම දෙන්න අනෙක් තැන් වලට ගිහිල්ලා හැල්ලුවට ලක් වෙන්න බෑ. පුදුම විදිහට එතන තියෙන්නේ සිස්ටම් එකක් නෑ. මෙතැන කරනවානම් සිස්ටම් එකට කරන්න පුළුවන්. ඒක නිසා ඉල්ලීමක් කරනවා. සභාවේ සභිකයන්ට, සේවකයන්ට, නිලධාරින්ට හා පවුල් වලට මෙතැන සූදානම් කරලා දෙන්න පුළුවන්නම් එහෙම කරන්න කියලා.

**03(10)** <u>**මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි, කොරෝනාවට පක්ෂයක් පාටක් නෑ. අපි කැමතියි. මේ ව්‍යසනයට උදව් කරන්න. කොරෝනා කමිටුව හරහා ඔබතුමාට අවශ්‍ය යෝජනා ලබාදීලා තියෙනවා. ඔබතුමා ඒ දේවල් ක්‍රියාත්මක කරලා තියෙනවා. මම ඔබතුමාට යෝජනා ටිකක් ඉදිරිපත් කරන්න කැමතියි මේ වෙලාවේ. මේ මන්ත්‍රීතුමිය කිව්වා වගේ මේ සභාවේ අපි මන්ත්‍රීවරු 48 ක් ඉන්නවා. එකක් නිරෝධායනය එකක් එන්නත්කරණය. එකක් අසාධ්‍ය වෙන රෝගීන්, මෙහෙම කොටස් 03 කට කැඩුවහොත් අපි මන්ත්‍රීවරු 48 ක් ඉන්නවා. පක්ෂ පාට බේදයකින් තොරව අපිට පුළුවන් අපේ දායකත්වය මේ සඳහා ලබා දෙන්න පුළුවන් කියලා. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. වැක්සිනේෂන් ඩ්‍රයිව් එක කළා වගේ සභාවේ මන්ත්‍රීවරුන්ව එකතු කරලා. කණ්ඩායම් 03 කට හරි කඩලා මොරටුවේ ජනතාවට හොට් ලයින් තුනක් දීලා හරි වැක්සිනේෂන් ඩ්‍රයිව් එකට ඉන්චාර්ජ් මන්ත්‍රීවරු පත් කරන්න. නිරෝධායනය පිළිබඳ ගැටළු තියෙනවා නම් ඒකට කණ්ඩායමක් පත් කරන්න. මේජර් සිටුවේෂන් එකක් ඇවිල්ලා රෝහල් ගතවෙන්න ඕනෑ නම් ඒකට කණ්ඩායමක් පත් කරන්න. මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරු විශාල කාර්යය භාරයක් ඉටු කරනවා නමුත්, ඔවුන්ට ෆෝන් ආන්සර් කරන්න බෑ. ප්‍රැක්ටිකල් ප්‍රශ්න ගොඩක් තියෙනවා මෙතැන. එම්ඕඑච් එකයි නගර සභාවයි අතර යම් යම් සට්ටන තියෙනවා. එක එක අවස්ථාවන් වලදී. අපිට පුළුවන් හැමෝටම චෝදනා කරන්න. ඒත් චෝදනා කරලා වැඩක් නෑ. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මොරටුවේ ජනතාවට මීට වඩා හොඳ සහනයක් සලසා දෙන්න.මේ මන්ත්‍රීවරු 48 ක් ඉන්නවා කණ්ඩායම් තුනක් හරි පහක් හරි හදලා මොරටුවේ කෙනෙක් නිරෝධානය සඳහා කන්දකාඩු හරි පූනානි වගේ තැනකට දානවා නම් දැඩි ලෙස මානසික ප්‍රශ්නයක් වෙනවා. කවුරුහරි ඒ වගේ ප්‍රශ්නෙකට පත් වුණොත් ඇඳක් හොයා ගන්න විදියක් නෑ. කවුහරි ඕනෑ ඇඳක් හොයා ගන්න. දේශපාලන කන්ට්‍රැක්ට් එක්ක තියෙනවා නම් මන්ත්‍රීවරයාට කථා කරලා මේ මන්ත්‍රීවරයාට කථා කරලා ඇඳක් හොයා ගන්න වෙන්නේ. අපි දන්නවා සමහර අයව නිරෝධායනය කරන්න බස්වල අරන් ගිහිල්ලා නැති කොරෝනා වැඩි වෙලා තියෙනවා. ඒ වගේ ප්‍රායෝගික ප්‍රශ්න ගොඩක් තියෙනවා. මම රජය පැත්තට ඇඟිල්ල දික් කරනවා නම් මට රජය අසමත් කියලා කරුණු ගොඩක් ගණනක් කියන්න පුළුවන්. ඒක මේ අවස්ථාවේ කිරිම තේරුමක් නෑ. අපි නගරයක් හැටියට ගමක් හැටියට ප්‍රශ්න තියෙනවා නම් ඒවාට විසඳුම් හොයන්න ඕනෑ. මම එතන ඉඳන් කථා කරන්නේ මම ඔබතුමාට යෝජනා කරනවා මෙතැන සභිකයෝ ඉන්නවා අපි වැඩ පිළිවෙලක් සාකච්ඡා කරමු. මොරටුවේ නිරෝධායනය වෙන අයට බඩු මල්ල ලබා දෙනවට අමතරව මොනවද අපෙන් වෙන්න ඕනෑ සේවාව. අපිට කරන්න පුළුවන් මොනවද කියලා අපි ඇක්ෂන් ප්ලෑන් එකක් හදමු. අසාධ්‍ය රෝගියෙක් හිටියොත් අයිසීයූ ඇඳක් නැතිනම් අයිසීයූ ඇඳක් ලබා දෙන්න උදව් කරන්නේ කොහොමද කියලා. මොරටුවේ රෝගීන් ගෙනියන්නේ කොහෙටද. ලුනාවට දානවද අපි කේ.ඩී.යු එකට කථා කරනවද නෙවිල් ප්‍රනාන්දු රෝහලට කථා කරනවද රජයට තිබුණේ දිස්ත්‍රික්ක බලලා කොළඹ දිස්ත්‍රික්කයේ රෝගීන් මෙහෙට

ගෙනියන්න. එහෙම පැහැදිලි ක්‍රමවේදයක් තියෙන්න පුළුවන්ද එහෙම ක්‍රමවේදයක් නෑ. මිලිටරි එක එහෙන් වැඩ කරනවා. ඩොක්ටර්ස්ලා එහෙන් වැඩ කරනවා. පළාත් පාලන ආයතන එහෙන් වැඩ කරනවා. මේ ආයතන තුන අතර කිසිම සංකලනයක් නෑ. ඒකට හොඳම උදාහරණය ඔබතුමා හොඳට වැක්සිනේෂන් කරා මොරටුව මහා නගර සභාව ඉදිරිපිට. ඒත් ලුනාවේ එහෙම නෑ. මම ඔබතුමාට යෝජනා කරනවා අපි එකඟ වෙනවා මේ අවස්ථාවේදී ඒක හින්දා පැහැදිලි වැඩ පිළිවෙලක් ඇති කරමු. රෝහල් ගතවෙනවා නම් කොහොමද? ඇඳක් ලබා ගන්නවා නම් කොහොමද? නිරෝධායනයට යනවානම් කොහොමද දෙවෙනි කරුණ මම මේක කොරෝනා කමිටුවේදිත් කිව්වා දැනුත් කියනවා. මොරටුවේ අවධානම් කලාප හඳුනා ගන්න ඕනෑ. හඳුනා ගැනීම ඉතා වැදගත්. ඒකට වැඩපිළිවෙලක් තියෙනවද? මොනවද අවධානම් කලාප. විල්ලෝරාවත්ත ලොක්ඩවුන් වෙලා. ඊළඟට ලොක්ඩවුන් වෙන්න තියෙන කලාප මොනවද? අපි දන්නවා මොරටුවේ ක්ලක්වර්ස් තියෙනවා. මොරටුවේ ජන ඝනත්වය වැඩියි. අවධානම වැඩි කලාප සඳහා අරගෙන තියෙන ක්‍රියාමාර්ග මොනවාද කොරෝනා ව්‍යාප්තිය වැළැක්වීමට. මොරටුවේ කොරෝනා අවධානම වැඩි කලාප හඳුනාගෙන ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මකවීම වැදගත් කියලා මම යෝජනා කරනවා. තුන්වෙනි එක ගැබිණි කාන්තාවන් අද වෙනකොට ලංකාවේ දෙසීයක් පමණ ගැබිණි කාන්තාවන් කොරෝනා වලට අසාධනය වෙලා තියෙනවා. මොරටුවේ මාතෘ සායන හරහා මේ ගැබිණි කාන්තාවන්ගේ තත්ත්වය හොයලා බැලුවද? ගැබිණි කාන්තාවන්ට ඉන්ජෙක්ෂන් ලබා දුන්නද මොකක්ද ඒ ගොල්ලන්ගේ තත්ත්වය. මම හිතනවා මේ සම්බන්ධව කටයුතු කරන්න මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන්ට කාර්යභාරය අධික නම් වෙන කමිටුවක් පත් කරන්න ගැබිණි කාන්තාවන්ගේ තත්ත්වය හොයලා බලන්න. ගැබිණි කාන්තාවන්ව වෙනම තැනකට අයිසි්යුලේට් කරන්න ඕනෑද කියලා හොයලා බලන්න. ඊළඟ එක ළමුන්ගේ අධ්‍යාපනය. ළමුන්ගේ අධ්‍යාපනය අඩාල වෙලා මේ කොරෝනා හින්දා. සභාවක් හැටියට ළමුන්ගේ අධ්‍යාපනය සඳහා අපිට දායකත්වයක් ලබා දෙන්න පුළුවන්ද. ඩයලොග්, මොබිටෙල් වැනි ආයතන තියෙනවා. ඒ ආයතන වලට කථා කරලා අපිට සහනදායි පැකේජ අඩුමගානේ මොරටුවේ ළමයින්ට හරි අරන් දෙන්න පුළුවන්ද ඔන් ලයින් පන්ති සඳහා. අපිට රටේ ප්‍රශ්න විසඳන්න බෑ. අපිට කරන්න පුළුවන් සීමිත සංඛ්‍යාවක්. මොරටුවේ පාසල් ගාන හඳුනාගෙන අපෝර්ඩ් කරන්න පුළුවන් ළමයි ඉන්නවා බැරි ළමයි ඉන්නවා. මොරටුවේ ළමයින්ගේ අධ්‍යාපනය සඳහා මොකක්ද අපිට ලබා දෙන්න පුළුවන් දායකත්වය. සභාව හරහා අපිට මේ ළමයින්ට ඩේටා පැකේජ් ලබා දෙන්න පුළුවන්ද. පාසල් වල විදුහල්පතිවරුන්ට කථා කරලා විදුහල්පතිවරුන් ගෙනල්ලා ඒ විදුහල්පතිවරුන් සමඟ සාකච්ඡා කරන්න. කථා කරලා ඒ ළමයින්ට ඒ පහසුකම ලබා දෙන්න වහාම කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා. ළමයින්ගේ අධ්‍යාපනය වැදගත්. මම කණගාටු වෙනවා මේ අවස්ථාවේදී. මම ජී.එල්.පීරිස් ඇමතිතුමාටත් චෝදනා කරනවා. මේවා රජයෙන් කරන්න ඕනෑ දේවල්. මේ තුන්වන ලොක් ඩවුන් එක පළවෙනි ලොක් ඩවුන් එකේ ඉඳලා මේ දක්වා ළමුන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් කිසිම සැලකිල්ලක් දැක්වූයේ නෑ රජය. මම කණගාටුවෙනවා අම්මා කෙනෙක් හැටියට මම ළමයාගේ ඔන් ලයින් පන්ති වලට කොච්චර සල්ලි වියදම් කරනවාද කියලා මම තමයි දන්නේ. සමහර ළමයින් කියනවා අපිට ඔන් ලයින් පන්ති එන්න බැරි වුණා. අම්මට ඩේටා කාඩ් එකක් අරන් දෙන්න සල්ලි නෑ කියලා. අපි මේ 2021 වර්ෂයේ ඉන්නේ. හරි ශෝචනීයයි මේ රට. අපි කණගාටුවට පත් වෙනවා නගරාධිපතිතුමනි. අපි මහජන නියෝජිතයෝ හැටියට. මම එදා කිව්වා කොරෝනා අරමුදලක් ඇති කරමු කියලා. ඔබතුමා කිව්වා කොරෝනා අරමුදලක් ඕන නෑ නගර සභාවේ සල්ලි තියෙනවා පාවිච්චි කරන්න පුළුවන් කියලා. මම ඔබතුමාට කියනවා සභාවේ සල්ලි පාවිච්චි කරන්න ළමුන්ගේ අධ්‍යාපනයට. මම ඔබතුමාට කියනවා මේකට අපි සම්බන්ධ වෙමු කියලා. නගර සභාවට අයිති නොවන සබ්ජෙක්ට් එකක් වුණාට විදුහල්පතිවරුන්ට කථා කරලා ලමුන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් කටයුතු කරමු කියලා. මම අහන්න කැමතියි මොරටුවට අනුබද්ධිත ඇම්බියුලන්සස් කීයක් තියෙනවද කියලා. ඔබතුමාට ඒකට උත්තර දෙන්න

පුළුවන්ද කියලා මම දන්නේ නෑ. මොරටුවට සම්බන්ධ ඇම්බියුලන්සස් කීයක් තියෙනවද එම ඇම්බියුලන්ස් ධාරිතාවය වැඩි කිරීමට කටයුතු කරන්න පුළුවන්ද. හදිසි අවස්ථාවකදී මොරටුවේ රෝගීන් සඳහා ඇඩිෂනල් ඇම්බියුලන්ස් තියෙනවද ඇම්බියුලන්ස් විදියට හදා ගන්න පුළුවන් වාහන තියෙනවද කියලා. මම සද්භාවයෙන් යෝජනා ඉදිරිපත් කරන්නේ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියට අපි අවස්ථාව දුන්නේ, ඇත්තටම ඔබතුමිය දැන් කථා කරන්නේ විවාදයකට සහභාගිවන විදිහටනේ. පැමිණිලි හා ආයවනා වලින් පැණලා ඔබතුමිය දැන් ඉන්නේ. නිශාන්ත මන්ත්‍රීතුමාට කියන්න අපි ඕන තරම් දුන්නේ එතුමා කථා කළේ මේවාට අදාලවයි. ඔබතුමිය අධ්‍යාපනයටත් ආවා.ඇම්බියුලන්ස් එකටක් ආවා. සෞඛ්‍යටත් ආවා. තවත් යයි. මේ සභාව මූලික කර ගන්න එපා මේ දවස විතරක් මූලික කර ගන්න එපා සියලු දේට. මේ දවස විතරක් මූලික කර ගන්න එපා. දවස් 365 තියෙනවා. ඒ 365 අපි ඕක කරමු.

<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මම මේ යෝජනා ඉදිරිපත් කළේ සද්භාවයෙන්. නගර සභාවක් හැටියට අපිට කොහොමද මේ දේට සහයෝගය දක්වන්න පුළුවන්. ඉදිරිපත් වෙන්න ඕනෑ. ඒ මතයේ තමයි මම මේ කරුණ ඉදිරිපත් කළේ.

03(11) <u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම ඔබතුමාගේ අවධානය වෙනත් කරුණක් සම්බන්ධයෙන් යොමු කරන්න කැමතියි. ගිය සුමානේ ප්‍රචාරයක් ගියා ඉඩම කොට්ඨාසයේ. එන්නත් කරණය කිරීම කරනවා යයි කියලා. ලුනාව ආරෝග්‍ය ශාලාවේ. ඒක එනවුස්මන්ට් එකක් කර ගෙන ගියා පොලිසියෙන් මුළු ඉඩම කොට්ඨාසයටම ඒ ස්ථානයේදී ඒක කරනවා කියලා. ඊට පසුව බොහෝ දෙනෙක් මගෙන් දුරකථනයෙන් විමසුවම මම පිළිතුරු දුන්නා. ලුනාව රෝහලේ මේක කරනවා කියලා. ඊට පහුවෙනි දින නගර සභාවේ වාහනයකින් දැනුම්දීමක් කරගෙන ගියා ඒ ස්ථානයේ නෙමෙයි. මේ ස්ථානයේ කරනවා කියලා. ඒ වෙලාවේ එතැන ලොකු කන්ෆියුෂන් එකක් ඇති වුණා මේ පිළිබඳව ඔබතුමාගෙන් විමසුවාම ඔබතුමා සනාථ කළා මේ ස්ථානයේ එය සිදු කරන බව. නමුත්, කරන්නේ කොහොමද කියලා දන්නේ නෑ. මගෙන් අහපු අයට මම කිව්වා මේ ස්ථානයට ඇවිත් පෝළිමේ ඉන්න එන්නත් කිරීම කරන්න පුළුවන් කියලා. නැවත වරක් ඔබතුමාය කථා කරනකොට ඔබතුමා දැනුම් දුන්නා මේකට නොම්මර බෙදා ගෙන යනවා ඒ අනුව වැඩේ කරගෙන යනවා කියලා. මම මේ පෙන්නුම් කරන්න හදන්නේ ඔබතුමා ඒ කරපු ක්‍රමය හොඳයි. නමුත්, එහෙම වෙලාවකදී කරුණා කරලා අපිවත් සම්බන්ධ කර ගන්න. අපි විපක්ෂයේ ඉන්නවා කියලා ඔබතුමා කරන දේවල් වලටවත් ඔබතුමාගේ රජය කරන දේවල් වලටවත් විරුද්ධ නෑ. විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට මම වගකීමෙන් කියනවා ඔබතුමාගේ පැත්තට ඇවිල්ලා ඕනෑම වෙලාවක ඕනෑම සහයෝගයක් මේ වැඩේ සම්බන්ධව කොන්දේසියක් නැතිව ඔබතුමාට අපි දෙන්න සූදානම්. මේ අවස්ථාවේදී මට ඔබතුමාට කියන්න උවමනා වුණේ මට ටිකක් මදිපාඩුවක් දැණුනේ මගේ කොට්ඨාසයේ බෙදෙන කොට කවුරුවත් මට කවුරුවත් කිව්වේ නැති එක. ඔබතුමාගේ මන්ත්‍රීවරු 23 දෙනෙක් හැම ආසනයක්ම නියෝජනය කරනවා. අපි මන්ත්‍රීවරු හයදෙනෙක් පමණයි ඡන්දයෙන් පත් වුණේ. අපි හය දෙනාවත් සම්බන්ධ කර ගෙන අපේ නිශාන්ත මන්ත්‍රීතුමා කිව්වා කිසිම පක්ෂ බේදයකින් තොරව එතුමාගෙත් සහයෝගය දෙනවා කියලා. මොන අඩුපාඩුවක් වුණත් අපි හිට ගන්නේ නගර සභාව පැත්තේ. ඔබතුමාගේ පැත්තේ. ඔබතුමා කරන හැම දේකදිම අපි ඔබතුමාව නිවැරදි කරනවා. මොකද අපිත් එකේ කොටස් කරුවන් නිසා. ඒ අඩුපාඩුව මම දැක්කා. ඒක ඉදිරියේදී හදා ගන්න. කියන්න ඔබතුමාට මම කැමති වුණේ ඊයේ මම මේ ස්ථානයට ආවා. ඒක ඉතාමත්ම හොඳට ඔබතුමා සංවිධානය කරලා තිබුණා. මම රූපවාහිනියෙන් ලංකාවේ ගොඩක් තැන්වල මම මේ වගේ වැඩසටහන් දැකලා තිබුණා. ඔබතුමා ඒ කරපු වැඩසටහන සංවිධානය කරලා තිබුණ පිළිවෙල ඉතාමත්ම අගය කරනවා. විපක්ෂයේ

මන්ත්‍රීවරයෙක් විදියට ඉතාමත්ම අගය කරනවා. මේකේ පොඩි අඩුපාඩුවක් තිබුණානම් ඒකත් මැකෙනවා. ඔබතුමා අපිව සම්බන්ධ කරගෙන තිබුණානම්. ඔබතුමා ක්‍රෙඩිට් එක ගන්න අපිත් සම්බන්ධ කර ගෙන. මෙතනදී කිව්වා වගේම සමහර අවස්ථා වලදී මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරු සම්බන්ධ කර ගන්න බැරි අවස්ථා තියෙනවා. මම හෝ එතුමා සම්බන්ධ කර ගන්න හැදුවානම් බෑ. කිසිසේත්ම බෑ. එතුමා හා එතුමාගේ නිලධාරිනුත් ලොකු මහන්සියක් දැක් වූවා ඒ එන්නත් කිරීමේදී. මෙන්න මේක ප්‍රායෝගික ප්‍රශ්නයක් ඒ මන්ත්‍රීතුමා කිව්වා වගේ. අපිට මේක මීට ඉස්සෙල්ලත් ඔබතුමාට කිව්වා රැස්වීමකදී. ලිහිණි මන්ත්‍රීතුමිය මුලින්ම මේ යෝජනාව ගෙනාපු වෙලාවේදී. සුනාමිය ආපු වෙලාවේදී ඔබතුමාට මතක ඇති. අපි මෙහේදි විශේෂ යුනිට් එකක් තියලා අපි සම්බන්ධීකරණය කරා. අපිට උපදෙස් ගන්න පුළුවන් සෞඛ්‍ය අංශ වලින් අවධානම් කලාප මොනවාද කියලා. මේ අවස්ථාවේදී අපිට ඇති කරන්න පුළුවන්නම් මොනවද අවධානම් කලාප එතුමන්ලා කාර්ය බහුල අවස්ථාවන්හීදි අපිට යම් තරමක සහයක් දක්වන්න පුළුවන් කියලා. මේ සම්බන්ධව ඔබතුමා නැවත වරක් මේ කොවිඩ් කමිටුව රැස් කරන්න. විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට එම කාර්යය ඉතාම හොඳට කිරීම සම්බන්ධව. ඔබතුමාටත්, කොමසාරිස්තුමාටත්, නිලධාරින්ටත් මාගේ ස්තූතිය හා පුණාමය පුද කරනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, විශේෂයෙන්ම මම හිතනවා අපේ කොවිඩ් 19 සම්බන්ධයෙන් කරන ලද ප්‍රකාශවල විශේෂයෙන්ම අපි දැක්ක දේ කරන්න අපි ලොකු උත්සහයක් ගත්තා. ඒ තමයි අපි මේක නිකම්ම කළේ නෑ. ලංකාවේ ඊයේ දිනයේදී එන්නත්කරණ දින, එන්නත්කරණ තැන් මොනවද කියන එක. මීට සතියකට දෙකකට උඩදී ප්‍රසිද්ධ කරපු ස්ථානවල තමයි එන්නත් කිරීම කළේ. නිශාන්ත මන්ත්‍රීතුමා කියපු එක හරි ලුනාව රෝහලේ තමයි මේ එන්නත් කිරීම කරන්න තිබුණේ. අපි දැක්කා දිගින් දිගටම එන්නත් කිරීම සඳහා අපි පොඩි උත්සහයක් දරලා දරලා ඒක අති සාර්ථක වුණාට පස්සේ තමයි අපි ඊට වඩා උත්සහයකට ගිහිල්ලා ඒක අති සාර්ථක කර ගත්තේ. අපි දිගින් දිගටම කොවිඩ් කමිටුවේ සභාපති හමුදාපතිතුමාට කිව්වා දැනට අපේ රෝගීන් 30 ක් විතර ඉන්නවා සේවකයින්. ඔවුන් ජනතා සේවාව කරන අය. ඒ නිසා කරුණාකරලා මොරටුව මහා නගර සභාවේ කොමසාරිස්තුමාගේ ඉඳලා පල්ලෙහා සෞඛ්‍ය කම්කරුවා දක්වා අපට එන්නත් ලබා දෙන්න. අපට එන්නත් ලබා දීපු දවසේ නගර සභාවේ එන්නත් කර ගත්තේ නැති මහජන මන්ත්‍රීවරුවරුන් හට අපි ඔවුන්ට වෙලාව දීලා වැඩේ කරාම අපි දැන ගත්තා අපිට මීටත් එහාට දියුණු කරන්න පුළුවන් කියලා. ඊට පස්සේ අපි එන්නත් කරපු දිනට පෙර දින මෙතැනට සම්බන්ධ වුණා පළාත් අධ්‍යක්ෂ, පළාත් සහකාර අධ්‍යක්ෂ, ප්‍රාදේශීය අධ්‍යක්ෂ මේ ඔක්කොම අය සම්බන්ධ වෙලා තීරණයක් ගත්තා. එන්නත් කිරීම කරනවා කියන්නේ එන එන මිනිස්සුන්ට ගහනවා කියන එක නෙමේ. අපි දිගින් දිගටම පුන පුනා කිව්වේ මිනිස්සුන්ට එන්නත් කරනවා කියන එකෙන් මේක අයින් කරන්න බෑ. මම කිව්වේ විල්ලෝරාවත්තට එන්නත් කිරීම මුලින්ම කරන්න. ප්‍රදීප් ශ්‍රියන්ත මන්ත්‍රීතුමා හැම තිස්සෙම කිව්වේ එන්නත් කරන්න ඕන තැනට නෙමෙයි එන්නත් කරන්නේ කියලා. මේ වෙලාවේ කොරළවැල්ලේ 85 ක් වෙනකන් රෝගීන් ඉහළ ගිහිල්ලා පොසිටිව් වෙච්ච අය. එතනට නෑ. දැන් මේ එන්නත් ගහපු තැන්වලට ඒ තරම් ලොකු ප්‍රශ්න නෑ. නමුත්, අපට මේ ස්ථාන වෙනස් කිරීමට කිසිවක් කරන්න බැරි වුණා. රාවතාවත්ත දකුණ, මොරටුවැල්ල උතුර සහ ඉඩම මේ තුනම විධිමත් විදියට මෙතැන විදින්න පෙරේදා රාත්‍රියේදී 8 වෙනකන්ම උත්සහයක යෙදුණා. පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂකතුමියගේ අනුමැතියෙන්, නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂකතුමියගේ අනුමැතියෙන්, කොළඹ අධ්‍යක්ෂතුමාගේ අනුමැතියෙන් යන මේ සියලු දෙනාගේ අනුමැතියට යටත් කරලා එන්නත්කරණ විදියත් එක්ක වැඩසටහන යනකොට අපි ඔතනට එන්නේ නෑ, එන්නත් කරන්නේ නෑ කියලා කියලා. නැවත සීමාව ඉක්මවා ඇමතිතුමා, රාජ්‍ය ඇමතිතුමා, හමුදාපතිතුමා, ජනාධිපතිතුමා දක්වා ගිහිල්ලා තමයි මේ එන්නත් කිරීම කර ගත්තේ. හෙට එන්නත් කිරීම කරනවානම් මම කියන්නේ කරුණාකරලා කොරළවැල්ල කරන්න. තෙලවල ඉවර කරන්න. දැන් මම දන්නවා මොරටුවැල්ලේ එන්නත් කිරීමට ඉන්නවා නම්, එන්නත් කිරීමට ඉන්නේ වයස තිහයි හැටෙයි සීමාවේ 50 ට අඩු සංඛ්‍යාවක්. ඉඩමේ ඉන්නවානම් ඉන්නේ 50 ට අඩු සංඛ්‍යාවක්. රාවතාවත්තේ ඉන්නවා. රාවතාවත්තේ අපි හරියට කරනවා. අන්තිමේට එන්නත් 1600 ක් එව්වා. තව 120 ක් ගෙන්නගෙන, 1720 ක් කළා. ඉතුරු වුණා 30 ක් ඊට පස්සේ තව 60 ක් ගෙනල්ලා 1780 ක් දක්වා වැඩි කළා.

මුලින්ම 500 යි දුන්නේ. ඊට පස්සේ 600 ක් ගෙන්න ගත්තා. ඊට පස්සේ 500 ක් ගෙන්න ගත්තා. ඊට පස්සේ 120 ක් ගෙන්න ගත්තා. ඊට පස්සේ තව 60 ක් ගෙන්න ගත්තා. මේක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින්ගේ අතේ තියෙන දෙයක්. වාසනාවන්තයි රෝසි සේනානායක මහත්මිය කොළඹ මහා නගර සභාවේ වෛද්‍යවරු ඔක්කොම එහේ ඉන්න නිසා එන්නත් ඔක්කොම දෙන්නේ මහා නගර සභාවට. මහා නගර සභා පනතේ තියෙන්නා වූ සෞඛ්‍ය බලධාරියා මහා නගර සභාව නම් මහා නගර සභාවේ ප්‍රධානියා විදියට මේ 24 ම අරගෙන පල්ලෙහාට ගලා ගෙන ගිහිල්ලා මේ ක්‍රමවේදයක් අනුව මම දන්නවා නිලධාරි මෙයට කැප වෙනවා. මහජන නියෝජිතයෝ කැප වෙනවා. දෙකම වෙනවා. ඒ නිසා නිවැරදි කරන්න.

ගරු මන්ත්‍රීවරුනි,සුනාමිය ආපු වෙලාවේ රවිනාත් ජේ. ගුණසේකර හිටපු නගරාධිපතිතුමා කියපු දේ හරි. රවිනාත් ගුණසේකර මැතිතුමා මේ එක්සත් ජාතික පක්ෂෙ පාලන කාලයක් ද කියලා අපිට මතක් වුණේ නැහැ අපේ නගරාධිපතිතුමා කියලා විතරයි මතක් වුනේ. අපි කිසිදු පැකිළීමකින් තොරව එතුමා මොකද කියන්නේ අපි ඒ කියපු දේට අනුගතවෙලා කියපු දේ කළා. නගරාධිපතිතුමා ඔයාට ඕන දේවල් කරන්න බෑ. මෙන්න අපේ යෝජනා කියලා යෝජනා දුන්නේ නෑ. අපිට ඕනකම තිබුණේ නගරාධිපතිතුමා මොකද කරන්නේ ඒ වෙලාවේ එතුමා හිතන දේ හරිද වැරදිද කියලා හිතනවට වඩා එතුමාට උදව් වෙන්න. ඒ නිසා මට මතකයි බත් මුල් කරේ තියාගෙන, ඕජස් ගලන මිනි වලට කර තියාගෙන ඒ කටයුත්ත අපි කළා. මම ඒක ඕනකමින්ම කියනවා. එගොඩඋයනේ අපේ ජයමාල් මන්ත්‍රීතුමාගේ ගෙදරට යන පාරේ එක මරණයක්. මොකක්ද ඒ පොදු ස්ථානයක් තියෙන්නේ. සුබසාධක ගොඩනැගිල්ල. ඒ ගොඩනැගිල්ලේ බොඩි එකක් තිබුණා. තියනකොටම තව රැල්ලක් එනවා කියපු ගමන් බොඩි එක අර ගත්තා පුංචි ළමයෙක්. ඒ ළමයාව අරගෙන ආවා සමරකෝන් ඉඩමට. පෙට්ටිය නැතුව අතේ අරන් ආවේ. තාමත් මට මතකයි අපි ගිහිල්ලා මිනිය වළලපු තැන. අපි රාත්‍රී 9.30, 10.00 වෙනකම් හිටියා. අපිට හිතුනේ නෑ නගරාධිපති රවිනාත් ගුණසේකර ද කියලා.අපිට හිතුණේ මිනිස්සු අපේ කියලා විතරයි. රාත්‍රී 9.30ට 10.00 වත් අපි බොඩි වැළලුවා. එකතැන කෝවිල පාරේ හතර දෙනෙක් මැරිලා 9.45 යි කඩලානේ සුසාන භූමියට ගේනකොට. ඒකනිසා මේ වගේ ඛේදවාචකයක් වෙලාවකදී මම හිතනවා මටනම් මොන වෙලාවකදීවත් පාටක් නෑ පක්ෂයක් නෑ ඒකට ජාතියක් නෑ. ඒකට ආගමක් නෑ. ඒ නිසාම අපි ගෙයින් ගෙට ගිහිල්ලා තුන්ඩු දුන්නා. මම හරි වාසනාවන්තයි. කවුද ඔබලට දුන්නේ කියලා ඇහුවම අපිට ලිහිණි මන්ත්‍රීතුමිය දුන්නේ කියලා කිව්වා. ඔබතුමිය ඒක කෝර්ඩිනේට් කරලා තිබුනා. එහෙමත් ඇවිල්ලා එන්නත් කර ගත්තා. එන්නත් කිරිමේදී එක්කෙනෙක්වත් නොම්මර දීපු අය පෝලීමේ හිටියේ නෑ. ඒක සාර්ථකයි. මේ වෙලාවේ මම විශ්වාස කරනවා. අපේ බය එකක්. ඔබතුමා කිව්වා හරි. කොරළවැල්ල, කල්දෙමුල්ල, තෙලවල බටහිර, ඉදිබැද්ද වැඩි වේගන යනවා. මම කාරුණිකව මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලීමක් කරනවා. අපේ හිටපු උප නගරාධිපතිතුමා සමහරක් වෙලාවට කියනවා. ඉස්සර මළගෙවල් වලට යනකොට එම්බාම් සුවඳ නැත්නම් ඔය යකාට නින්ද යන්නෑ කියලා. දැන් කියන්නේ නෑ. ඉස්සර කියනවා. මම සුනිල් නන්දසිරි මාසකෝරාල මන්ත්‍රීතුමාටත් කියනවා, අනිත් මන්ත්‍රීවරුන්ටත් කියනවා කවුරු මැරිලා හිටියත් ගෙදර අම්මා තාත්තා හැර සහෝදරයෙක් හැර කවුරු මැරිලා හිටියත් රිපෝට් එක එනකන් යන්න එපා. ඉන්දියාව වගේ නුගත් වෙන්න එපා. අපි මිනි බදා ගන්න යන්න ඕනෑ නෑ. අපේ යුතුකම් තියෙනවා කරන්න. ඒක කර ගන්න බැරි නම් ඒකට අවශ්‍ය මුදල් නැතිනම්, අපි ඒක කරමු. අපි කථා වෙලා ඒක කරමු. යන්න එපා. මම දන්නවා. අපේ සමහර මන්ත්‍රීවරු සමහර වෙලාවට ගේ ඇතුළට යන්නේ නෑ. සමහර වෙලාවට ගිහිල්ලා සියලු කටයුතු සූදානම් කළාට පස්සේ රිපෝට් එක එනවා පොසිටිව් කියලා. එතකොට සමහර වෙලාවට දුර ගිහිල්ලා වැඩියි. ඒ නිසා මේ වෙලාවේ අපි 48 දෙනා හරියට හිටියොත් පක්ෂය මොකක් වුණත් ජනතාවගේ වැඩේට සහයෝගය දෙන්න අපි 48 දෙනාට පුළුවන්. අපි 48 දෙනා පසුවෙලා අනෙක් අය පෙළ ගැසුණොත් අසාර්ථක වෙනවා. අපි 48 දෙනා ශක්තිමත් වෙන්න ඕනෑ. අපි කථා කරලා සම්පූර්ණයෙන්ම ගරු මන්ත්‍රීවරුන්ටවත් කාටවත් මරණයක් වුණාට පස්සේ පරික්ෂණය කරනතුරු මැදිහත්වීම සිදුකිරීම අවශ්‍ය විදිහට සිදු කරන්න කියන කාරුණික ඉල්ලීම කරනවා.

ගරු මන්ත්‍රීවරුනි, මම විශේෂයෙන්ම කියනවා ගරු රවිනාත් ගුණසේකර මැතිතුමනි, අපි රෙජිස්ටර් කර ගත්තා අතපසුවෙච්ච අය. අද මට ෆැක්ස් එක එවන්න කිව්වා. ඒ අයට එන්නත් ටික දෙනවා.

විශේෂයෙන්ම ඉවර කළොත් රාවතාවත්ත දකුණ නම් දකුණ ඉවර කරලා තමයි මම රාවතාවත්ත නැගෙනහිරට යන්නේ. මෙතනින් කොනක් එතනින් කොනක් අල්ලගෙන බෙහෙත් ගහලා වැඩක් නෑ. එහෙම තමයි දැන් බෙහෙත් ගහන්නේ. එහෙම තමයි කරන්නේ. හරි හිතුවක්කාර විදියට ලූනාවේ ඊයේ අපිට ලොකු ප්‍රශ්නයක් තියෙනවා. ඊයේ එන්නත් කරන්න තිබුණේ ලූනාවේ රෝහලේ විතරයි. ඒත් එගොඩඋයනෙත් ගහනවා. විශාල ප්‍රශ්නයක් ඒක. අද වෙනකොට එතුමාට පරික්ෂණයක් පැවැත්වෙන තත්ත්වයට ගිහිල්ලා. මොකද අපිට එන්නත් මදි වෙලා. අපිට එන්නත් නොදී ඉඳලා. ඊයේ අපේ වැඩ පිළිවෙල අසාර්ථක කරන්න, අවසාන මොහොතෙදී කොමසාරිස්තුමාට අපි එන්නේ නෑ, ඔතන වැඩේ කරන්න දෙන්නේ නෑ, ඒ තත්ත්වයට පත් කරලා වෛද්‍යවරයා කථා කරලා තිබුණා. අපිට මේවා ප්‍රශ්න නෙමේ. අපිට ඕනේ අපි අපේ ඩියුටිය කරන්න. මාව මේ ගමන පත් කරපු ජනතාවගේ පැත්තේ නෙමෙයි මම හිට ගත්තේ. එහෙනම් මම ඔවුන්ටම දෙන්න ඕනෑ කියලා පරසක්වල ගහනවා. එහෙම දෙයක් මට උවමනා වුණේ නෑ. කොහේ හරි කමක් නෑ තැනකදී එන්නත් ගහනවා නම් ප්‍රාදේශීය ලේකම්ගෙන්, ග්‍රම සේවකගෙන් විස්තර අරගෙන ගහන්න තියෙන්නේ. වයස 30යි 60 අතර සංඛ්‍යාව 2000ක් ඉන්නවානම්, එයට එන්නත් 2000 ක් නැත්නම් එන්නත් කරලා වැඩක් නෑ. එක්කෙනෙක් හරි ඉතුරු වුණොත් එයාගෙන් බෝවෙන්න පුළුවන් දිගටම. ඒ නිසා එන්නත්කරණ වැඩසටහනේදී රෝසී සේනානායක මහත්මිය මේ වෙනකොට දිනුම්. සමහරවිට මුළු කොළඹම ගත්තාට වඩා මොරටුවෙන් වැඩි වෙනවා එක් ආසනයක. කොළඹටම වඩා 5 ට වඩා පිළියන්දල වැඩිවෙනවා එක ආසනයක. එතුමිය අති සාර්ථකයි. අපෙත් සාර්ථක බාවයට පත්වෙච්ච තැනක් තියෙනවා ඒක ගැන කවුරුවත් කථා කරන්නේ නෑ. අඟුලාන ගැන කථා කරන්නේ නෑ. අඟුලාන සාර්ථක භාවයට පත්වෙලා තියෙන්නේ. අඟුලානෙන් රෝගීන් වාර්තා වෙන්නේ නැති ගානටම ගිහිල්ලා ඉවරයි. එන්නත්කරණයේදි ඔවුන්ට එන්නත් හරියට ලබා දීපු නිසයි. අන්න ඒක තමයි කළ යුත්තේ. ග්‍රාම සේවා වසම් එකක් දෙකක් අරගෙන ඒ දෙක තුනටම ඉවර වෙන්න ගැහුවානම් මේක වෙන්නේ නෑ. ඒක ගැන කථා කරන්න අවාසනාවකට වෛද්‍යවරු එන්නේ නෑ. ඊළඟ දවසේ අපි සාකච්ඡා කරලා, ලිහිණි මන්ත්‍රීතුමිය කිව්වා වගේ එන්නත් වලට අපේ කවුද ඉන්නේ, ඒ එක්කම මෙහෙයුම් මධ්‍යස්ථානය නම් අනිවාර්යයෙන්ම කරනවා. ලිහිණි මන්ත්‍රීතුමිය ICU ඇඳන් වෙන් කරලා තියන්න පුළුවන් එකක් නෙමෙයි. ඒක අනිවාර්යයෙන්ම කොළඹ තිබුණත්, පානදුරේ තිබුණත්, හදිසියේ ඉන්නවානම් යාපනයේ රෝගියෙක්, පානදුරේ නම් ICU එකේ ඇඳ තියෙන්නේ එයාව ගේන්න වෙනවා. ඒ ඇඳන් වලට තහංචි නෑ ICU කියලා දාන්න තියෙන්නේ. මොන විදියකටවත් හෙට මාව ICU එකට දාන්න වුණොත් ICU එකේ ඉන්නේ යාචකයෙක් නම් ඒ යාචකයාගේ පණ යනකන් එයාව අදින්නේ නෑ. ගරු මිල්ටන් මන්ත්‍රීතුමා මිය යන මොහොතේදී ICU එක පෙනි පෙනි රෝගියෙක් ඉන්නවා. ඔහුගේ පණ යන්නෙත් නෑ. මිල්ටන් මන්ත්‍රීතුමාව දාගන්නත් බැරි වුණා. ඒ නිසා ICU කියන ඒවට වෙන් කිරීම් කරන්න පුළුවන් එකක් නෙමේ. එහෙම කිව්වොත් අපි මුකුත්ම නොදන්න මිනිස්සු කියලා හිතනවා. වෙන් කරන්න පුළුවන් දේවල් තියෙනවා. අපි ඊළඟ සාකච්ඡාවේදී කරනවා ඒක. ICU එකට යවන්න ඕනෑ රෝගීන් ඉන්නවා නම් ICU පහසුකම් තියෙන තැනකට යවන්න. හුස්ම ගන්න අපහසු අය ඉන්නවානම් ඔක්සිජන් තියෙන තැනකට යවන්න. තමන්ට සුවසේ ඉන්න පුළුවන් අය ඉන්නවා නම් ඒ වගේ තැනකට යවන්න. මම 14 දෙනෙක්ව හොඳටම නිරෝගී කරලා නගර සභාවෙන් යැව්වා වගේ මේ මොරටුවේ අයව ස්ථානගත කිරීම සඳහා කොහේ හරි තැනක් සූදානම් කරන්න අපි උත්සහ කරනවා. ඒක කොහොම හරි කරන්න ඕනෑ. ඔබතුමියත් මට පොඩි උපදෙසකුත් දුන්නා. බලාගෙන මේක කරන්න මේකට අවසර තියෙනවද කියලා. ඒක තමයි උඩින් එන බළල් අත. එහෙම එයාට කරන්න බෑ. එහෙම කියලා ඔබතුමියලාගේ ඔළුව කනවා. යම් කෙනෙක් යම් රකුසෙක්. ඒ රකුසා ඔළු කනකොට ඒවා විකෘති වෙලා එළියට වචන එනවා. ඒක තමයි ඇත්ත. සත්‍ය ඒකයි. ඒ කියන කෙනාට කියනවානම් ඔහොම කියන එක වැරදියි. ඔබ ගිහිල්ලා උපදෙස් දෙන්න ඒක එයාට කරන්න කියලා ඒ කියන කෙනාට එහෙම කියනවානම් මෙහෙම වෙන්නේ නෑ. අපි මීට වඩා ඉස්සරහට ගිහිල්ලා. මේ මොරටුවේ ජනතාව අවසනාවන්ත මිනිස්සු නෙමෙයි. මච්චිම බේර ගත්ත විරුවන් ඉන්න නගරයක්. අපි සියලුදෙනා එකතුවෙලා එතැනට යමු.

ගරු මන්ත්‍රීවරුනි, විශේෂයෙන්ම මම හිතනවා නිශාන්ත ප්‍රදිනාන්දු ගරු මන්ත්‍රීතුමනි, ඔබට ප්‍රශංසනීය ස්තුතියක් ඒ කියපු දේවල් ඔක්කෝටම අපි අවනතයි. අපි එකහයි. ගරු රවිනාත් ගුණසේකර

මැතිතුමා, ගරු සේනක දමයන්ත මැතිතුමා, තිසර මෙන්ඩිස් මැතිතුමා, සුනිල් නන්දසිරි මාසකෝරාළ මැතිතුමා, අනුරසිරි ද සිල්වා මැතිතුමා, සිත්ති මසීනා මන්ත්‍රීතුමිය, ලිහිණි මන්ත්‍රීතුමිය අපි එකඟයි. ප්‍රදීප් ශ්‍රියන්ත මන්ත්‍රීතුමාට, සුජිත් පුෂ්පකුමාර මන්ත්‍රීතුමාට අපි එකඟයි. අපි ඊළඟ කමිටුවේදී තෝරා ගෙන වෙන් කර ගමු. ඒකට අපි අවශ්‍ය කටයුතු කරමු. මෙහෙයුම් මැදිරියක් හදමු. රවිනාත් ගුණසේකර මැතිතුමනි, ඒ පිළිබඳව අත්දැකීම් තියෙන කෙනෙක් විදියට ඊයේ දිනයේදී එතැනට ආවා. බොහොමත්ම ස්තූතිය. අපි ඒ වැඩසටහන ක්‍රමවත් විදියට කළා. ඔබතුමා ශක්තිය දෙන්න ආවා. අපි සියලු දෙනා එකතු වෙලා එකම පාටකට යමු. එකම තීරණයකට යමු. එක තැනක හිට ගමු. හිටගෙන අපි ඊට පස්සේ විවිධාකාර මතවාදයන්ට යන්න පුළුවන්. අහිංසක ජනතාවට කුමන හෝ සේවයක් කරපු සභාවක් විදියට අපි සතුටු වෙමු. නිශාන්ත ප්‍රදිනාන්දු මන්ත්‍රීතුමා සුනාමියේදී මම හිටියේ 5 වෙනි පුටුවේ උනාට සුනාමියේදී මම කරපු කාර්යය පිළිබඳව තවමත් මම සංතෝෂ වෙන්නේ විපක්ෂ මන්ත්‍රීවරයෙක් හැටියට. කුණු ටික දාන්න තැන් නැති වෙනකොට කුණු ටික දාන්න තැන් දෙනකොට එතනදී මම සංතෝෂ වෙන්නේ මම විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් නිසා. අපිට ලොකු අවැඩක් වෙන්නේ නෑ. මම හිතනවා ප්‍රසංසනීය කථා වලට මගෙත්, ආණ්ඩු පක්ෂේ ගරු මන්ත්‍රීවරුන්ගේ ප්‍රසංසාව ඔබ සියලු දෙනාට හිමි වෙනවා.

## 04. <u>ප්‍රශ්න</u> - නැත

## 05. <u>යෝජනා</u>

**05 (1) හා 05 (2)** <u>මහ නගර සභා මන්ත්‍රී - ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය</u>

ගරු නගරාධිපතිතුමනි, අංක 05(1) යෝජනාව සහ අංක 05(2) යෝජනා වලට සංශෝධන ඇති බැවින්, එම යෝජනා දෙක මම ඉල්ලා අස්කර ගන්නවා.

**05(3)** <u>මහ නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදි.</u>

"මොරටුව මහා නගර සභාව විසින් ආරම්භ කරන ලද කසළ කළමණාකරන වැඩපිළිවෙල සම්බන්ධයෙන් මොරටු ජනතාව මෙන්ම අනෙකුත් පලාත් පාලන ආයතන තුලද ප්‍රසාදයක් එල විය.එම වැඩපිලිවෙල ආරම්භයේ තිබූ සාර්ථකභාවය ක්‍රමයෙන් අඩාල වීමට පටන්ගෙන තිබේ.ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන මෙම සභාව ඉහත අඩුපාඩු හදුනා ගනිමින් මෙම ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට කටයුතු කල යුතු යැයි යෝජනා කර සිටින්නීය".

මහා නගර සභා මන්ත්‍රී කේ.ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා විසින් ස්ථිර කරන ලදි.

<u>මහ නගර සභා මන්ත්‍රී - එ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමණි, මේ පවතින තත්වය ඉතාම දරුණු හා බරපතල තත්වයක් නිසාම අවාසනාවන්ත ලෙස මේ සභාවේ සේවකයන් පිරිසක් මේ රෝගයේ ගොදුරු බවට පත්වීම නිසාම මේ තියෙන දරුණු තත්වය නිසාම මේ යෝජනාව ඉතාම කෙටියෙන් ඉදිරිපත් කරනවා. වැදගත් යෝජනාවක් ලෙස මම දකිනවා.මොකද අපි ආරම්භ කරපු මේ ව්‍යාපෘතිය ඉතාම යෝග්‍ය ඉතාම හොද යෝජනාවක් ලෙස මම දකිනවා.ඒ පිළිබද කිසිදු දෙගිඩියාවක් නෑ මට අවසර දෙන්න මේ පිළිබද පුංචි යෝජනා ටිකක් ඉල්ලීම් ටිකක් තියෙනවා.අපි දකින අඩුපාඩු කිහිපයක් මේ සභාවට ඉදිරිපත් කරලා හැකි ඉක්මණින් මේ කටයුත්ත නිම කරලා ඉතාම සාර්ථක ව්‍යාපෘතියක් බවට පත්කරගන්න. එක

තමයි ගරු නගරාධිපතිතුමණි, මේ ව්‍යාපෘතිය අපි ආරම්භ කලාට පස්සේ අපේ මේ පත්‍රිකාව අනුව දින දෙක බැගින් අපිට ලබා දි තිබෙනවා.මා දන්නවා මේ තත්වය පිළිබඳ සැලකිල්ලට ලක්කරමින් තමයි මේ අදහස ඉදිරිපත් කරන්නේ මොකද තාමත් අපි කසල අංගනයේ වැඩ කටයුතු ආරම්භ කරලා නෑ එතන සැලකිය යුතු ප්‍රශ්ණයක් තියෙනවා.එක අපිට තේරෙනවා ඒ කටයුතු නැවත ආරම්භ කලාට පස්සේ විශේෂයෙන් මාගේ ඉල්ලිම මේ මහල් නිවාස වල ජිවත්වන ජනතාව බරපතල ප්‍රශ්ණයකට මුහුණ දෙනවා.තමන්ගේ ඉතාම සීමිත භූමි ප්‍රමාණයේ මේ කසල ටික දින කිහිපයක් රඳවා තැබීම පිළිබඳ මුහුණ දෙන ගැටලු, අවම වශයෙන් මේ දින දෙකයි. මොකද දින දෙක අදින්නේ නෑ කියන ප්‍රශ්ණය ජනතාවගේ පැත්තේන් එන්නේ එක හැකි ඉක්මණින් ක්‍රියාත්මක කරන්න සහ එහි තව ගැටලුවක් තියෙනවා.ප්ලාස්ටික් පොලිතින් එකතු කිරිමේදි ගරු නගරාධිපතිතුමා පොලිතින් වර්ග නැවත වර්ගිකරනයට ලක්කරන්න කියන කාරනය හා ඒ සේවක මහතුන් විසින් ජනතාව දැනුවත් කරනවා කියන චෝදනාව එනවා.මොකද අපි විශ්වාස කරනවා එක ප්‍රායෝගිකව කල නොහැකි දෙයක් බව අපේ සෞඛ්‍ය භාරව සිටින මහත්වරුන් පිළිගන්නවා එ නිසා අපි ඉල්ලිමක් කරනවා එ කටයුත්ත හැකි ඉක්මණින් ජනතාව දැනුවත් කරන්න එ වගේම මේ කටයුත්තේදි දැනුවත් කරන්න පුලුවන් සියලු දෙනා දැනුවත් කරලා වඩා විධිමත් ලෙස මේ ප්‍රශ්ණයට හොද පිළිතුරක් ලබාදිමට ඉදිරියේදි කටයුතු කරන්න කියන ඉල්ලිම කරනවා.එ වගේම තැනින් තැන කසල පිච්චිම දිගටම සිදුවෙනවා. ගරු නගරාධිපතිතුමණි එක ඉතාම පරිසරයට බරපතල හානිදායක තත්වයක් එනිසා අපි විශ්වාස කරනවා දිනපතා කසල එකතු කිරිමේ වැඩ පිළිවෙල මීට වඩා විධිමත් උනාට පස්සේ එ කටයුත්ත සමනය කරන්න පුලුවන් වෙයි කියලා. මේ ඉල්ලීම් ටික විශේෂයෙන් මහල් නිවාස වල ජනතාවගේ කසල බැහැර කිරිමේදි එකතු කිරිමේදි මීට වඩා විධිමත් යාන්ත්‍ර ණයක් ජනතාව පිඩාවට පත්නොවන යාන්ත්‍රණයක් සකස් කරන්න කියන ඉල්ලිම කරමින් මේ යෝජනාව මම ඉදිරිපත් කරනවා.මේ සම්බන්ධයෙන් මැදිහත්විම් කරන සියලු දෙනාට ස්තුතිවන්ත වනවා විශේෂයෙන් කසල සේවක මහතුන් මේ තියෙන තත්වය යටතේ ඉතාම හොදින් තමන්ට හැකි අයුරින් මේ කටයුත්ත හොදින් කරනවා.මේ පිළිබඳ අපේ ස්තුතිය පුදකරනවා.මේ තියෙන අඩුපාඩු ටික අපි අඩුකරගත්තෝත් මම හිතනවා මේ ව්‍යාපෘතිය ඉතාම හොද ආදර්ශමත් ඉතාමත් ප්‍රායෝගිකව ව්‍යාපෘතියක් බවට පත්කරන්න පුලුවන් වෙයි කියලා මේ යෝජනාව ඉදිරිපත් කරමින් මගේ අදහස් පල කිරිම අවසන් කරනවා.

<u>නියෝජ්‍ය නගරාධිපති - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමණි මේ අවස්ථාවේ අපි ස්තුතිවන්ත වනවා සුදේශ් මන්ත්‍රිතුමාට මේ යෝජනාව සම්බන්ධව එහි හොද නරක අවබෝධකරගෙන මේවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම පිළිබදව. ඒවගේම මම මේ අවස්ථාවේ ඔබතුමාගෙන් ඉල්ලිමක් කරනවා මෙයට අදාලව මොරටුව වෙරළ තීරයේ ගරු නගරාධිපතිතුමණි, මේ වෙනකොට කුණුදාන ප්‍රමාණය වැඩියි. එ වෙරළතිරයේ වෙනදාට වඩා අවස්ථා ගණනාවකදිම අපි වෙරළ තීරය සුද්ද කරා.කොච්චර කරත් ජනතාව අමාරුයි හුරුකරගන්න. මේ නිසා අපි මොකක් හරි වැඩ පිළිවෙළක් කරලා එ වෙරළ තීරයේ මිනිසුන්ව විශේෂ දැනුවත් කිරිමක් කරමු.මොකද අපේ ට්‍රැක්ටර එනකන් ඒ මිනිස්සු බලන් ඉන්නේ නෑ.එ මිනිස්සුන්ගේ වරද එ නිසා මොකක්හරි නිතිමය වශයෙන් දඩුවම් දෙන ආකාරය පිළිබඳ දැනුවත් කරලා මේකට නිසි ක්‍රමවේදයක් සකස් කරමු. ඔබතුමා ගිය වේලාවක බලන්න ගොඩක් තැන්වල කුණු දානවා.කුණු කළමණාකරනය කරලා දෙන්න අවශ්‍යතාවක් මේ මිනිස්සුන්ට නැහැ. ඒ පිළිබඳ විශේෂ අවධානය යොමු කරන්න ලෙස ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එච් .ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමණි කසල බැහැර කිරිම පිළිබද අදාළ යෝජනාවක් නිසා එ යෝජනාවට අදාල කරගෙන මම මේ කාරණය මතක් කරන්නේ.මේ කාරණය මතක් කරාම සමහර විට ආමානුෂික අදහසක් කියලා හිතෙන්න පුලුවන් නමුත් ගරු නගරාධිපතිතුමණි, මෙකේ කාරණා දෙකක් දෙපැත්තේන් තියෙන නිසා පසුගිය කාලවකවානුවේ අපේ සේවකයන් කසල බැහැර කිරිම නිසා කොවිඩ් තත්වයට මුහුණ දුන්නා. නමුත් ගරු නගරාධිපතිතුමා අද වන විට නිරෝධානය වන නිවෙස්වල කසල බැහැර කිරිම අපි කරන්නේ නෑ.මුල්කාලයේ අපි ක්‍රමවේදයක් හදලා කරා.නමුත් දැන් අපි දැනට එක කරන්නේ නෑ.මට පෙරේදා කථා කරා කොරලවැල්ල පළමුවෙනි පටුමගේ එ ගෙදර දුවට කොවිඩ් හැදිලා.වර්ග අඩි 200 නැහැ ඒ ගෙදර. අම්මාට තාත්තාට පොසිටිව් තුන්දෙනාම ඇතුලේ ඉන්නේ කුණුටික දාගන්න තැනක් නෑ.හමුදාපතිතුමා ජනේල් දොරවල් අරින්න කියනවා.නමුත් කොහොමද ජනේල් දොරවල් අරින්නේ. වටේම දරුවෝ ඉන්නවා. කසල දාගන්න විදියක් නෑ.එහෙම ගැටලු තියෙනවා.එ නිසා මේ පිළිබදව සංවේදිව සලකා බලන්න කියලා ඉතාම ඕනෑ කමින් ඉල්ලා සිටිනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

මහා නගර සභා මන්ත්‍රීවරුනි, මං හිතනවා ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂකතුමා ඔබතුමා විශේෂයෙන් අවධානය යොමු කරන්න. කොවිඩ් අසාධනයට පත්වුන අයතුලින් තව අය නිර්මාණය විමට ඉඩ දෙන්න බෑ.අන්තර්ජාලයේ තිබුණා පිටරටක "අඩු වශයෙන් ඔබගේ ජනේල පියන ඇරලා බෙල්ලවත් දාන්න එපා එතරම් භායානකයි කෝරොනා කියලා" මාධය ජාලවල ගොඩක් ගියා. ප්‍රදිප් ශ්‍රියන්ත ගරු මන්තිතුමා කියපු එක හරි යථාර්තය ඒයයි.එනිසා මම හිතනවා මේවා හදුනගෙන මෙවායේ තොරතුරු ඉල්ලගෙන කටයුතු කල යුතුයි.අද වාහන තුනම යොමු කරලා තියෙනවා ඒ ප්‍රදේශයේ වැඩ කරන්න. වේලා තියෙන්නේ අපි එක පැත්තකින් අපේ සේවකයන්ව විධිමත්වෙන විධියට යවන්න.ඔවුන්ගේ කුණු ගන්න ගිහිල්ලා අපේ අය හදවගන්න ඕන නෑ.මම හිතනවා ඔබතුමා එ වැඩපිළිවෙල සම්බන්ධයෙන් නිරන්තර අවධානයෙන් සිටින්න.

<u>නගර සභා මන්ත්‍රී - එච් ප්‍රදිප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා</u>

සමාවෙන්න නගරාධිපතිතුමණි, නැත්නම් වෙන්නේ කසල ටික පාරේ ගෙනත් දානවා. ඊට වඩා බරපතල ප්‍රශ්ණයක් වෙන්න පුලුවන්.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, මේ වෙන කොට කුරුල්ලෝ මියගිය සංඛ්‍යාව වැඩියි.කාක්කා කියන සතා ඔහේ ගිහිල්ලා කුණු අවුස්සනවා.කුණු මග අතහැරලා දාලා තිබුණොත් එවා වෙන්න පුලුවන්. කෙහෙන් කෙහොම හරිවෙන්න පුලුවන්. ඔබතුමා විශේෂයෙන්ම මේ පිළිබද උනන්දුවෙන්න. උපනගරාධිපතිතුමා ඇත්තම කියනවානම් අපි සියලුදෙනාම එකතුවෙලා ඒ වැඩේ කරමු. මම ප්‍රදිප් ශ්‍රියන්ත මන්තිතුමා ඒක්ක අපේ ගමේ ගියා බඩු බෙදන වැඩ සටහනට ,ඔසද මන්තිතුමත් ගියා. දැනට දින දාහතරයි පහලව පටන්ගත්තා.කවුරු හෝ යන්න විල්ලෝරවත්ත පාරකට කුණු තියෙනවානම් මට ඇවිල්ලා කියන්න අතන තියෙනවා කියලා. දවස් දාහතරකින් ගිහිල්ලා නෑ වාහනයක්.අපි දේශපාලන නායකයෝ නායකත්වය දියයුත්තේ ඔන්න ඔතනට මම එකට ප්‍රසංසා කරනවා.මම එදා යනගමනුත් එ නම කිව්වා කියලා ප්‍රදිප් ශ්‍රියන්ත මන්ත්‍රීතුමාට ඔසද මන්තිතුමාට මතක ඇති.මම කිව්වා මම නෙමේ කලේ මේක රවිනාත් ජේ ගුණසේකර නගරාධිපතිතුමාගේ කාලේ සම්පත් කියන

පරිපාලකවරයා විල්ලෝරවත්තේ තියෙන කුණුගොඩවල් සියල්ල අයින් කලා.කුණු පාරට දාන සිස්ටම් එක මම අයින් කලා.නමුත් මේතුමා කුණුගොඩවල් තියෙන එක නතර කරා විල්ලෝරවත්ත පරිපාලක වරයාගේ කාලේ එතුමා ඒක කලා. මම ඒක ඉස්සරහට ගෙනියලා 15 ක් දැන් පටන්අරගෙන තාම නෑ.නමුත් ඒක මොකක් හරි කරන්න වෙලව තව දුරට තියාගෙන ඉදීම තුල මගේ අයියා(පොඩිම නැන්දගේ පුතා)අද උදේ ජීවිතක්ෂයට පත්වුනා කොවිඩ් වලින්.එයාගෙ නම විජය ලාල්.එයාගෙ අක්කා හුස්ම ගන්න බැරුව බොහොම අමාරුවෙන් ඉන්නවා.අපි සියලු දෙනා එකතු වෙලා මේ වැඩේ කල යුතුමයි.ගරු සුදේෂ් මන්ත්‍රීතුමනි ඔබතුමාට ස්තුතියි.සේවක සංඛ්‍යාව අඩුනිසා නැවත දවස් තිහට රුපියල් තුන්දහස් තුන්සියයක් අතිකාල දුන්නා.ඔවුන්ට කියන්න එපා වෙන්කිරීම කරන්න කියලා.ඔබ වෙන්කරන්න කියලා දුන්නා.අද මොරටුව මහා නගර සභාවේ රියදුරා හා කසල අදින කෙනා රුපියල් පහලොස්දහසක අතිකාල ගන්නවා.මුළු මුදලම ගත්තම රුපියල් හැටහසක් පමණ ඔවුන්ට මාසයට හම්බවෙනවා.අපි ඔවුන්ගේ වැඩේ ගන්නවා වගේම ඔවුන්ට සැලකීම කරනවා.ඔබතුමාට මම ස්තුති වන්ත වෙනවා.මේක මම දැනගෙන හිටියේ නෑ.ඔවුන්ට අපි කියලා තියනවා එකම නිවසකටවත් මේ පඩිවිඩය දෙන්න එපා.ඔයගොල්ලො කල යුතු දෙයක්.ඒක නිසා රුපියල් හයදහස් හයසියයක් දෙන එක තුන්දහස් තුන්සියයක් වැඩි කරලා දැන් නමදහස් ගානක් දෙනවා.වෙනම රුපියල් හාරදහස් පන්සියයක් දෙනවා දිරි දීමනාවක් කියලා.වෙනම තිස්හත්දහසක් වැටුප් ගෙවනවා.තව යකඩ,පොල්කටු ගෙනාවම සම්පූර්ණයෙන්ම ඒවාට මුදල් දෙනවා.සමහර අය සමහර දවසට ගන්නවා හාරපන්දහක්.ඒ විතරක් නෙවෙයි.

ගරු සුදේශ් මන්ත්‍රීතුමා කොරෝනා නිසා පොඩ්ඩක් අතපසුවුනා.පොල්කට්ටට වරිපනම් නිදහස් කියලා වැඩ සටහනක් ගේනවා ලබන මාසෙ ඉදලා.වරිපනම් රුපියල් හාරසියට අඩු හැම ගෙදරකින්ම පොල්කටු හතලිහක් දුන්නම අවුරුද්දේ වරිපනම් නිදහස් කරනවා.මොරටුවේ දහසයදහක් ඉන්නවා තමන් පරිහරණය කරන පොල්කට්ටෙන් තමන්ගෙ වරිපනම් බදු නිදහස් කරගන්න.ඒකත් අපි කරන්න ඉන්නවා.ලඟි ලඟියේ ඔබතුමාට ප්‍රශංසනිය ස්තුතිය එහෙමනම් අපි මේ වැඩේ කරමු. සෞඛ්‍ය කමිටුවට විශේෂයෙන් අරගෙන මම කථා කරනවා. ඔබතුමන්ලාගේ නියෝජනයකුත් එවන්න කටයුතු කරන්න.

**අංක 05 (3) යොජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**06 <u>2021 අප්‍රේල් මස ස්ථාවර කමිටු වාර්තා සලකා බැලීම.</u>**

**<u>නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මෙම සභා රුස්වීමේ සිට කමිටු වාර්තා සළකා බැලීමේදී අදහස් ඉදිරිපත් කරන්න එක් පක්ෂයකට එක් අවස්ථාවක් බැගින් ලබාදෙනවා.

**06(1) <u>2021.04.05 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ කමිටු තීරණ සලකා බැලීම.</u>**

**2021.04.05 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු තීරණ ඒකමතිකව සභා සම්මත විය.**

**06(2) <u>2021.04.06 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ කමිටු තීරණ සලකා බැලීම.</u>**

**2021.04.06 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු තීරණ ඒකමතිකව සභා සම්මත විය.**

**06(3) <u>2021.04.06 දින පැවති මහජන උපයෝගිතා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ කමිටු තීරණ සලකා බැලීම.</u>**

**2021.04.06 දින පැවති මහජන උපයෝගිතා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු තීරණ ඒකමතිකව සභා සම්මත විය.**

**06(4) <u>2021.04.07 දින පැවති පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ කමිටු තීරණ සලකා බැලීම.</u>**

<u>මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>
ගරු නගරාධිපතිතුමනි, පවතින කොවිඩ් තත්ත්වය මත මහජන පරීක්ෂකවරු සඳහා දුරකථන වලට අදාල දිරි දීමනාවක් ලබාදෙන්න පුළුවන්නම් හොඳයි.ගිය සතියේ කටුකුරුන්ද,ජෝසප් පෙදෙස කොවිඩ් මරණයක් සිදුවුණා.මියගිය ගෙදර අයට වත්කමක් නෑ පෙට්ටියටවත් ගන්න.අපට සභාවක් විදියට කොවිඩ් මරණවලින් මියගිය පවුල් වල අයට මුදල් වියදම් කරන්න හැකියාවක් නැති අයට පෙට්ටිය අරන් දෙන්න පුළුවන්නම් හොදයි කියලා යෝජනා කරනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>
ගරු මන්ත්‍රීවරුනි,අපි මල්ශාලාවක් එක්ක කථාකරමු. මොරටුවේ සියලුම කොවිඩ් මරණ එම මල් ශාලාවට අවම මුදලකට මෙම සේවාව සඳහා පොරොන්දු කරගමු. ඉල්ලීම් කරන අයට එම සහනය ලබාදෙන්න තීරණය කරමු.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>
ගරු නගරාධිපතිතුමනි,කෝටිපතියොත් කොවිඩ් හැදිලා අසරණ වෙලා තියෙනවා.ඊයේ දවසේ සළුසල සභාපතිතුමා කොවිඩ් හැදිලා නැතිවෙලා තියෙනවා.එයාගෙ ගෙදරින් ඔක්සිජන් මැෂින් එකකුත් ඉස්පිරිතාලයට ලබාදීලා තියෙනවා එයාව ගොඩදාගන්න.
අන්තිමේදී එයා මැරෙනකොට එයාගේ නෝනටත් කොරෝනා හැදිලා තියෙනවා.අවුරුදු නමයක ළමයෙකුත් ඉන්නවා. අපිට සභාවක් වශයෙන් කොවිඩ් හැදිලා මැරෙන මිනිසුන්ගේ දේහයන් නගර සභාවේ වියදමින් කරන්න පුලුවන්නම් හොදයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>
ගරු නගරාධිපතිතුමනි,පෙරේදා ඔය වගේම මරණයක් වෙලා රුපියල් තිස්පන්දහක් අරගෙන එන්න කියලා තියෙනවා.එතනම හිටපු පුද්ගලයෙක් කියලා තියෙනවා රුපියල් හත්දහසකට කරලා තියෙනවා කියලා.එකතැකකට කථාකරලා දෙන්න ක්‍රමයක් සූදානම් කරන්න කියලා මම කියනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>
ගරු නගරාධිපතිතුමනි,එහෙම කරන එක හොඳයි.හොඳ අදහසකට ආවා.සභාවක් විදියට ගත්ත තීරණය අතිශය වැදගත්වෙනවා.

**2021.04.07 දින පැවති පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු තීරණ ඒකමතිකව සහා සම්මත විය.**

**06(5)** <u>2021.04.07 දින පැවති ක්‍රීඩා කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තීරණ සලකා බැලීම.</u>

**2021.04.07 දින පැවති ක්‍රීඩා කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු තීරණ ඒකමතිකව සහා සම්මත විය.**

**06(6)** <u>2021.04.08 දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තීරණ සලකා බැලීම.</u>

**2021.04.08 දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු තීරණ ඒකමතිකව සහා සම්මත විය.**

**06(7)** <u>2021.04.08 දින පැවති ව්‍යාපෘති සහ භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තීරණ සලකා බැලීම.</u>

**2021.04.08 දින පැවති ව්‍යාපෘති සහ භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු තීරණ ඒකමතිකව සහා සම්මත විය.**

**06(8)** <u>2021.04.09 දින පැවති ඵලදායිතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තීරණ සලකා බැලීම.</u>

**2021.04.09 දින පැවති ඵලදායිතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු තීරණ ඒකමතිකව සහා සම්මත විය.**

**06(9)** <u>2021.04.09 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තීරණ සලකා බැලීම.</u>

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>
ගරු නගරාධිපතිතුමනි, මුදල් කමිටුවේ 11(3) කරුණ පැහැදිලි කිරීමක් කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.රුපියල් තුන්සිය දක්වා වරිපනම් බදු ගෙවන ලබනු ස්ථානවලින් මාසයකට පොල් කටු හතලිහක් ලබාදෙන්න කියන කරුණ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, පොල්කටු කිලෝ එකක් රුපියල් නමයක් දහයක් අතර තමයි ගන්නෙ.එක ගෙදරකට පොල්කටු තිස්පහක් හතලිහක් අතර තමයි අපි හදලා තියෙන්නේ.මාසයකට පොල් කටු තිස්පහක් හතලිහක් ආවම අපි වරිපනම් වලින් නිදහස් කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මුදල් කමිටු වාර්තාවේ අංක 9 හා 12 කරුණට අපි විරුද්ධයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජේ ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මුදල් කමිටු වාර්තාවේ අංක 9 හා 12 කරුණට අපි විරුද්ධයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මුදල් කමිටුවටම නිහඩතාවය ප්‍රකාශ කරනවා.

**2021.04.09 දිනැති මුදල් පිළිබඳ ස්ථාවර කමිටුවේ සියලුම කමිටු තීරණයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

| | | |
|---|---|---|
| 01. නගරාධිපති | - | ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 02. නියෝජ්‍ය නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 03. මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 04. මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 05. මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 06. මහා නගර සභා මන්ත්‍රී | - | එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 07. මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 08. මහා නගර සභා මන්ත්‍රී | - | පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 09. මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා |
| 10. මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ලලිත් ප්‍රනාන්දු මහතා |
| 11. මහා නගර සභා මන්ත්‍රී | - | එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 12. මහා නගර සභා මන්ත්‍රී | - | එෆ්.බී.නිලංක සිල්වා මහතා |
| 13. මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 14. මහා නගර සභා මන්ත්‍රී | - | දීපා චාන්දනී ආරියවංශ මහත්මිය |

**2021.04.09 දිනැති මුදල් පිළිබඳ ස්ථාවර කමිටුවේ අංක 09 හා අංක 12 යන තීරණ වලට විරුද්ධවත් අනිකුත් සියලුම කමිටු තීරණයන්ට පක්ෂවත් පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

| | | |
|---|---|---|
| 1. මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සුනිල් නන්දසිරි මාසකෝරාල මහතා |
| 2. මහා නගර සභා මන්ත්‍රී | - | රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා |
| 3. මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා |
| 4. මහා නගර සභා මන්ත්‍රී | - | යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 5. මහා නගර සභා මන්ත්‍රී | - | යූ.සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 6. මහා නගර සභා මන්ත්‍රී | - | මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 7. මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |

8. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය

**2021.04.09 දිනැති මුදල් පිළිබඳ ස්ථාවර කමිටුවේ සියලුම කමිටු තීරණයන්ට පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු පක්ෂව හෝ විපක්ෂව ඡන්දය දීමෙන් වැලකී සිටියහ.**

1. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා

**2021.04.09 දිනැති මුදල් පිළිබඳ ස්ථාවර කමිටුවේ සියලුම කමිටු තීරණයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

(මෙම අවස්ථාවේදී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ.)

1. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ඩබ්.ඒ.රන්දු නිරෝෂන මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය
5. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - එම්.කුමාර රාජරත්න මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - එම්.පිලිප් ෆැන්සිස් ප්‍රනාන්දු මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය
12. මහා නගර සභා මන්ත්‍රී - එච්.උපිත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - පී.ගාවින් මත්තෙස් මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - ආර්.එම්.ඒ.දෝන දිලාශිනී මහත්මිය
16. මහා නගර සභා මන්ත්‍රී - යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එම්.සුදර්ශනි ප්‍රියන්තිකා කුරේ මහත්මිය
19. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
20. මහා නගර සභා මන්ත්‍රී - ආර්.ක්‍රිෂනි ප්‍රනාන්දු මහත්මිය
21. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය
22. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා)

**07.** <u>ලැබීම් ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශන වැඩ ප්‍රගති වාර්තාව</u>

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, මුල්‍ය වාර්තාව ඉදිරිපත් වී නොමැති බව දන්වා සිටිනවා.

**08.** <u>පුද්ගලික ස්වභාවයේ කරුණු</u>

<u>මහා නගර සභා මන්ත්‍රී -ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි,අපි ලබාගත් ඇස්ට්‍රාසෙනිකා එන්නතේ දෙවනි මාත්‍රාව ලබාගන්නා විදියක් නැති එක සමාජයේ ගැටලු සහගත තත්ත්වයක්.තවද කොරෝනා හැදුනු අවුරුදු 14 ක වයස්වල ගැහැණු ළමයින්වත් පොලොන්නරු යවනවා.ඒක හොද තත්ත්වයක් නොවෙයි. පාසල් ළමුන් ගෙදරට වී සිටන බැවින් පාසල් ළමුන්ට රූපවාහිනිය නාලිකාවක් අධ්‍යාපනය සඳහා වෙන්කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**09** <u>වෙනත් කරුණු</u> - නැත.

සභාවේ වැඩකටයුතු මෙතනින් අවසන් විය.

**අ.කලේ/ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු**
**නගරාධිපති,**
**මොරටුව මහා නගර සභාව,**
**මොරටුව.**

**2021.05.18 දින,**
**මොරටුව මහා නගර සභා කාර්යාලයේදීය.**